# සමාජ සේවා අමාත්‍යාංශය
# 2013
# කාර්ය සාධන වාර්තාව

සමාජ සේවා අමාත්‍යාංශය

1 වන මහල

සෙත්සිරිපාය 2 වන අදියර

බත්තරමුල්ල

ටෙලි : 0112 887349 - 51 ෆැක්ස් : 0112 877381

විද්‍යුත් තැපැල් : msssec@sltnet.lk

# පටුන


| | |
|---|---|
| මෙහෙවර | v |
| අරමුණු, ප්‍රධාන කාර්යයන් හා නීති අණ පණත් | vii - ix |
| 1. පාලන අංශය | 01 - 11 |
| 2. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සහ ජාතික සභාව | 12 - 19 |
| 3. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (සී.බී.ආර්) | 20 - 22 |
| 4. උපදේශන අංශය | 23 – 26 |
| 5. තනි මා-පිය පවුල් සංවර්ධන ව්‍යාපෘතිය | 27 - 32 |
| 6. සිසු ඥාන පුබුදුව වැඩසටහන | 33 - 34 |
| 7. සමාජ සත්කාරක මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 35 - 41 |
| 8. ගිණුම් අංශය | 42 - 45 |
| 9. සැලසුම් හා මෙහෙයුම් අංශය | 46 - 48 |
| 10. අභ්‍යන්තර විගණන අංශය | 49 - 50 |

# මෙහෙවර ප්‍රකාශය

“සමාජ සුභසාධනය හා සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, මෙහෙයුම් හා නායකත්ව මඟින් සමාජයේ අවාසි සහගත තත්වයන්හි සිටින අයට හිතකාමී පරිසරයක් හා අවස්ථා උදාකර දීමෙන් ඒ අයද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම. ”

<u>අරමුණු</u>

- සමාජයේ සියළුම අවාසි සහගත කණ්ඩායම් සඳහා සමාජ අයිතිවාසිකම් සහ අවස්ථාවන් සහතික කිරීම.
- සමාජයේ අඩු වරප්‍රසාදලාභී කොටස් සඳහා සමාජ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය ලබාදීම.
- පුද්ගලයින් සිය පවුල් ඒකක සහ ප්‍රජාවන් තුළින් බැදී වෙන්ව යන සියළුම බලවේගයන්ට විරුද්ධව සටන් කිරීම සහ සමාජයේ ඊට ගොදුරුවූවන්ගේ එකමුතුභාවය සහතික කිරීම.
- අඩුවරප්‍රසාද ලාභී පුද්ගලයන්ට ආත්ම විශ්වාසය තුළින් ඔවුන්ගේ සමාජ සහ ආර්ථික දියුණුව උදාකරලීමෙහිලා සහායවීම.
- කාර්යක්ෂම සේවාවන් සඳහා සමාජ වැඩකරුවන්ගේ හැකියා සංවර්ධනය කිරීම.
- සමාජ ආරක්ෂණ ක්‍රම මගින් ස්වයං රැකියාවන්හි නියුතු පුද්ගලයන්ගේ පවුල් වැඩි දියුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා ක්‍රියාකාරකම්

- සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කිරීම.
- සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නව ආයතන ඇතිකිරීම හා දැනට ඇති ආයතන රාමුව ශක්තිමත් කිරීම.
- ඉලක්ක කණ්ඩායම් සඳහා සේවය කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීම.
- සමාජ සංවර්ධනය හා සුභසාධන වැඩසටහන් සඳහා මග පෙන්වීම, සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම.
- සමාජ සංවර්ධනය පිළිබඳව ලෝක සමුළුවේදී ඇතිකරගත් පොරොන්දු සහ පසු විපරම.
- සමාජ සංවර්ධන කළමණාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරීම.

- ❖ කලාපීය සහ උප කලාපීය මට්ටමේ සමාජ සුභසාධන ආයතනවල වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ❖ සමාජය තුළ ජීවත්වන ආබාධ සහිත පුද්ගලයින් සමාජය තුළින්ම පුනරුත්ථාපනය කිරීම.
- ❖ උපදේශන සේවාවේ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.
- ❖ වැඩිහිටි කොටස්වල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.
- ❖ විපතට පත් කාන්තාවන්ගේඅයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම.
- ❖ මානසික ආබාධවලින් මිදුන පුද්ගලයන් නැවත සමාජගත කිරීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම.
- ❖ දිළිඳු ළමුන්ගේ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සඳහා "සිසුණැන පුබුදුව" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## නීති අණ පනත්

i. 1947සැප්තැම්බර් 21 දින දරණ ගැසට් නිවේදනය මඟින් සමාජ සේවා දෙපාර්තමේන්තුව 1948 පෙබරවාරි 01 දින පිහිටුවන ලදී.

ii. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන දෘශ්‍යාබාධිත පුද්ගලයින් පුනරුත්ථාපනය සඳහා වූ භාරකාර අරමුදල 1992 වසරේ අංක 9 දරණ පණතින් ස්ථාපනය කොට ඇත.

iii. ජාතික සමාජ සංවර්ධන ආයතනය පිළිබඳ 1992 අංක 41 දරණ පණත.

iv. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ 1996 අංක 28 දරණ පනත.

v. ආබාධිත භාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2003

vi. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ 2003 අංක 33 දරණ පනත (සංශෝධිත).

vii. මැතිවරණ (විශේෂ විධි විධාන ) පිළිබඳ 2011 අංක 28 දරණ පනත.

viii. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ 2000 අංක 9 දරණ පනත.

ix. ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය හා ජාතික ප්‍රතිපත්තිය - 2006

x. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ 2011 අංක 5 දරණ පනත (සංශෝධිත).

xi. ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්තිය (කෙටුම්පත).

# 01. පාලන අංශය

**මෙහෙවර**

**"සමාජ සේවා අමාත්‍යාංශයේ හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් කළමණාකරණය සඳහා ආයතන රෙගුලාසි හා චක්‍රලේඛ වලට අනුකූලව දැඩි කැපවීමෙන් හා උනන්දුවෙන්, කාර්යක්ෂමව පරිපාලනය කරමින් සඵලදායීත්වය ලඟාකර ගැනීම අපගේ අධිෂ්ඨානයයි"**

සමාජ සේවා අමාත්‍යාංශයේ විෂය පථයට පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන සහ අංශ ඇතුලත් වේ.

1. සමාජ සේවා දෙපාර්තමේන්තුව
2. ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා ජාතික සභාව
3. ජාතික සමාජ සංවර්ධන ආයතනය
4. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය හා ජාතික සභාව
5. ජාතික උපදේශන මධ්‍යස්ථානය
6. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (සී.බී.ආර්)

**2013 .01.01 සිට 2013. 12.31 දිනට කාර්ය මණ්ඩල විස්තර**

**විශ්‍රාම ගැනීම්**

| අනු අංකය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|
| 01 | එම්.ඩී.සී. ජයමාන්න මයා | අධ්‍යක්ෂ (ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය) | 2013.08.14 |
| 02 | අයි.එච්. රූපසිංහ මිය | රා.ක.ස.සේ I | 2013.08.01 |
| 03 | ඩබ්.ඩබ්. බොතේජු මයා | කා.සේ.සේ I | 2013.04.27 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| අනු අංකය | නම | තනතුර | සේවය අවසන් කළ දිනය |
|---|---|---|---|
| 01 | කේ.පී.ඩී.ඩී.එන්. කරුණානායක මිය | රා.ක.ස.සේ III | 2013.05.08 |

**තනතුරෙන් මුදා හැරීම්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය ස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 01 | බී.ජ්.ඩබ්. බමුණුසිංහ මෙනෙවිය | රා.ක.ස.සේ III | අධ්‍යාපන අමාත්‍යාංශය (ශ්‍රී ලංකා ගුරු සේවය) | 2013.01.01 |
| 02 | බී.සී. ප්‍රියදර්ශනී මෙනෙවිය | රා.ක.ස.සේ III | අධ්‍යාපන අමාත්‍යාංශය (ශ්‍රී ලංකා ගුරු සේවය) | 2013.09.02 |

**අමාත්‍යාංශය වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරුවී පැමිණි ස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 01 | එච්.එම්.එස්. ජයතුංග මිය | අතිරේක ලේකම් (පාලන) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 2013.05.07 |
| 02 | එස්.ඒ.ඩී.එස්. සුහසිංහ මිය | අතිරේක ලේකම් (සංවර්ධන) | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 2013.05.15 |
| 03 | ජේ.ඒ.එස්. රවීන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ(ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 2013.08.14 |
| 04 | එස්.ඩී.උඩවත්ත මහතා | අතිරේක ලේකම් (පාලන) | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | 2013.12.19 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | එම්.කේ.කේ. රසිකා අබේදීර මිය | අධ්‍යක්ෂ (උපදේශන) | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 2013.02.26 |
| 06 | ආර්.බී.කේ. රණසිංහ මිය | රා.ක.ස.සේ I | කාර්මික අධ්‍යාපන ආයතනය | 2013.12.26 |
| 07 | අජන්තා වික්‍රමරත්න මිය | රා.ක.ස.සේ I | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 2013.02.01 |
| 08 | එම්.සී.එස්. බෝල්සිං මෙනෙවිය | රා.ක.ස.සේ I | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2013.07.04 |
| 09 | ආර්.පාලිත මයා | රියදුරු | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2013.01.21 |

**අමාත්‍යාංශය වෙතින් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය ස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 01 | එන්.කේ.අබේරත්න මිය | අතිරේක ලේකම් (පාලන) | ළමා සංවර්ධන අමාත්‍යාංශය | 2013.05.10 |
| 02 | එම්.සී.එල්. ප්‍රනාන්දු මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 2013.05.15 |
| 03 | එච්.එම්.එස්. ජයතුංග මිය | අතිරේක ලේකම් (පාලන) | ජනාධිපති ලේකම් කාර්යාලය | 2013.11.21 |
| 04 | එම්.එච්.එල්. සමීල් මහතා | අධ්‍යක්ෂ (උපදේශන) | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 2013.01.01 |
| 05 | ඩී.එම්.එස්.ඒ. නිරෝෂන මහතා | සහකාර අධ්‍යක්ෂ (ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 2013.09.02 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | ජී.ජී.එන්.ඒ. පෙරේරා මිය | භාෂා පරිවර්තක | ජනාධිපති ලේකම් කාර්යාලය | 2013.10.21 |
| 07 | එස්.වී.කේ. තමරා මිය | සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරී | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 2013.01.23 |
| 08 | එච්.අයි. ඉන්දිකා මිය | සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරී | වැකේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013.10.30 |
| 09 | ඒ.එන්. මඩිහගේ මිය | රා.ක.ස.සේ II | අධ්‍යාපන අමාත්‍යාංශය | 2013.01.01 |
| 10 | එස්.එම්. සිරිවර්ධන මයා | රියදුරු | විභාග දෙපාර්තමේන්තුව | 2013.01.01 |
| 11 | ආර්.ඒ.ආර්.ද ජයතිලක මහතා | රියදුරු | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 2013.05.21 |

**2013.12.31 දිනට පහත සඳහන් උපාධිධාරීන් 208 දෙනෙක් අමාත්‍යාංශය යටතේ සේවය කරති.**

01. උපදේශන සහකාර - 93

02. සැපයුම් සහකාර - 02

03. සංවර්ධන සහකාර - 02

04. ඒකක සහකාර - 06

05. සංවර්ධන සහකාර (උපදේශන) - 85

06. සංවර්ධන නිලධාරී - 20

**2013.12.31 දිනට සංවර්ධන සහකාර (අධිසේවක ) නිලධාරීන් 08 දෙනෙක් අමාත්‍යාංශය යටතේ සේවය කරති.**

## අමාත්‍ය මණ්ඩල සංදේශ හා උපදේශන කාරක සභා

**2013.01.01සිට 2013.12.31 දක්වා උපදේශක කාරක සභා පැවැත්වූ දිනයන්**

01. 2013.02.20
02. 2013.03.19
03. 2013.04.10
04. 2013.05.21
05. 2013.07.25
06. 2013.09.05

## 2013.01.01 දින සිට 2013. 12.31 දක්වා තිරුබදු සහන නිර්දේශ කිරිම.

| අනු අංකය | ආයතනයේ නම | පරිත්‍යාගකරු |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ, වර්ල්ඩ් විෂන් ලංකා මරදාන, කොළඹ | ඇමරිකා එක්සත් ජනපදය |
| 02. | කොළඹ මිතුරු සංගමය | එක්සත් රාජධනිය |
| | | ජායිපූර් ඉන්දියාව |
| | | ඉන්දියාව |
| 03. | ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය | සිංගප්පූරුව |
| 04. | වෙසෙල්ස් ඔනස් | අත්ලාන්තික් |
| 05. | කොළඹ මිතුරු සංගමය | ඉන්දියාව |
| 06. | ඩොන් බෝස්කෝ පාදර් ශිරන් කරවුගෝඩගේ | ඉතාලිය |
| 07. | ගරු ෆීලික්ස් පෙරේරා (පා.ම.)<br>සමාජ සේවා අමාත්‍යාංශය | කුවෙට් රාජ්‍යය |
| 08. | ශ්‍රී.ලංකා දෘෂ්‍යාබාධිත මණ්ඩලය | දකුණු අප්‍රිකාව |
| 09. | ප්‍රාජා මූලික මධ්‍යස්ථනය | ස්විට්සර්ලන්තය |
| 10. | සිස්ට රෝබිනා පොලින් හෝලි කොස් පෙවන්සිස් | ස්විට්සර්ලන්තය |
| 11. | ගරු නියෝජ්‍ය අමාත්‍ය විනායගමූර්ති මුරලිදරන්. | සිංගප්පූරුව |
| 12. | ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය | සිංගප්පූරුව |
| 13 | එම්.බී. ජයවර්ධන මිය<br>මහ නගර සභා කොමසාරිස්<br>කොළඹ මහ නගර සභාව | කොරියාව |
| 14. | සමාධි එක්සත් සංවර්ධන පදනම | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 15. | සිංහ සමාජය- වත්තල | ඔස්ට්‍රේලියාව |

## 2013.01.01සිට 2013.12.31 දක්වා විදේශ ශිෂ්‍යත්ව 15 අමාත්‍යාංශ නිලධාරින් වෙත ලබාදී ඇත.

| ගොනු අංකය | වැඩසටහන | සහභාගී වූ අයගේ නම සහ තනතුර | විදේශගත වූ රට | කාලය |
|---|---|---|---|---|
| MSS/3/4/5/1/2013 | ප්‍රජා මූලික රැකියා සහය තුලින් අබාධ සහිත පුද්ගලයන් ආර්ථික සවිබල කරණය. | ඩී.එම්.එස්.ඒ නිරෝෂණ මයා<br>සහකාර අධ්‍යක්ෂ<br>සී.පී.එල්.ෆෙනැන්ඩු මහතා.<br>සමාජ සේවා නිලධාරී | ජපානය | 2013.01.09 - 02.02 |
| MSS/3/4/5/2/2013 | තෙවන කලාපීය ආබාධිත සමානාත්මතාව පුහුණු කරුවන් සඳහා පුහුණු වැඩසටහන. | එම්.එන්.එස්.උදය කුමාර මහතා<br>සමාජ සේවා නිලධාරී | මැලේසියා | 2013.01.8-18 |
| MSS/3/4/5/3/2013 | ධාරිතාව නැංවීමේ පුහුණු වැඩසටහන. | එච්.එම්.සී.ජේ. හේරත් මිය<br>කථිකාචාර්ය | ඉන්දියා | 2013.01.07-31 |
| MSS/3/4/5/4/2013 | අබාධිත සහිත පුද්ගලයන් සඳහා සමාන අයිතිවාසිකම් පිළිබඳ කලාපීය පුහුණුව හා ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධනය. | එස්.පී. වේත්තැව මිය.<br>සමාජ සේවා නිලධාරී | තායිලන්තය | 2013.02.05-09 |
| MSS/3/4/5/5/2013 | ධාරිතා සංවර්ධන වැඩමුළුව. | ඉමෙල්ඩා සුකුමාර් මිය<br>ලේකම් | නේපාලය | 2013.03.18-22 |
| MSS/3/4/5/7/2013 | අබාධ සහිත පුද්ගලයන් සඳහා වන උපදේශනයන් හා බහු වර්ෂ ධාරිතා නැන්වීමේ වැඩසටහන. | ඉමෙල්ඩා සුකුමාර් මිය<br>ලේකම්<br>පී.ඒ.ජී. ෆනැන්ඩු මිය<br>අධ්‍යක්ෂ ස.සේ.දෙ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | | එම්.රාමමූර්ති මහතා<br>අධ්‍යක්ෂ - සැලසුම්<br>කේ.එන්.එල් සිරිමෙවන් මහතා<br>අධිකාරි<br>ජී.එල්.එල්.ගුණසිංහ මිය.<br>අධිකාරි<br>එන්.අයි.කරුණාසේන මහතා.<br>අධිකාරි<br>එම්.ඒ.පි.මුණසිංහ මහතා.<br>අධිකාරි<br>පි.ඒ.කේ.දයාවංශ මහතා.<br>අධිකාරි<br>ඒ.එච්.එම්.යූ. සම්පත්<br>වැඩ කළමණාකරු<br>යූ.එල්.රාජපක්ෂ මහතා .<br>වෘර්තිය උපදේශන<br>ජී.බි.කේ.පද්මසිරි මිය.<br>වෘර්තිය උපදේශන<br>එන්.එස්.ධර්මවර්ධන මයා.<br>වෘර්තිය උපදේශන | | |
| MSS/3/4/5/8/2013 | සමාජ කළමණාකරණයේ නියතු කාන්තා නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය | රසික අබේදීර මිය<br>අධ්‍යක්ෂ ( උපදේශන)<br>ජී.ඒ.එම්.එස්.පි.විජේසේකර මිය<br>කථිකාචාර්ය<br>යමුණා කුමාරි මිය.<br>සමාජ සංවර්ධන නිලධාරි | චීනය | 2013.06.03-17 |
| MSS/3/4/5/9/2013 | ටෝකියෝහි තෙවන කලාපීය සමුළුව | එස්. කුමාර මහතා.<br>සමාජ සංවර්ධන නිලධාරි | ජපානය | 2013.08.22.-24 |

| | | | | |
|---|---|---|---|---|
| MSS/3/4/5/10/2013 | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින්ගේ නායකත්ව සංවර්ධනය සඳහා ඕස්ට්‍රේලියානු නායකත්ව පුහුණු වැඩසටහන මොනෑෂ් විශ්ව විද්‍යාලය මෙල්බන්. | ඒ.ජී. ෆනැන්ඩු මිය.<br>අධ්‍යක්ෂ<br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | ඕස්ට්‍රේලියා | 2013.08.31 - 2013.09.22 |
| MSS/3/4/5/11/2013 | අධ්‍යාපන චාරිකාව සහ සමුළුව | ආර්.ජයසිංහ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>ඒ.ජී. ෆනැන්ඩු මිය.<br>අධ්‍යක්ෂ සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>කේ.ඩී.ඩී.ආරියරත්න මිය<br>ගණකාධිකාරී<br>ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>එම්.එස්.එම්.අස්මියාස්<br>පුහුණු නිලධාරී<br>ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>එම්.ඩී.ජී.චන්ද්‍රසෝම<br>සමාජ සේවා නිලධාරී<br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | ජපානය | 2013.11.06 - 11 |
| MSS/3/4/5/12/2013 | ව්‍යසනයකින් හා කම්පනයකින් පසු මනෝ සමාජීය මැදිහත්වීම | පී.අරුමතුරෙයි<br>උපදේශන සහකාර | චීනය | 2013.10.07 - 15 |
| MSS/3/4/5/13/2013 | විශ්ව ආබ්ධිත ක්‍රියාකාරී සැලැස්ම පිලිබඳ උපදේශනය | සී.පී.එල්.ප්‍රනාන්දු මහතා<br>සමාජ සේවා නිලධාරී | පිලිපීනය | 2013.10.30 – 31 |
| MSS/3/4/5/14/2013 | උපාය මාර්ග දර්ශක හා ඵලදායී දත්ත උත්පාදනය පිලිබඳ විද්වත් සමුළුව | එම්.රාමමූර්ති<br>අධ්‍යක්ෂ (සැලසුම්) | තායිලන්තය | 2013.11.06 - 07 |

| | | | | |
|---|---|---|---|---|
| MSS/3/4/5/15/2013 | ආසියානු පැසිෆික් සංඛ්‍යාංක පුස්තකාල පිළිබඳ සමුළුව | ඩී.කේ.අයි.විජේරත්න මහතා<br><br>පරිගණක වැඩසටහන් නිලධාරී | ඉන්දියාව | 2013.12.09 - 12 |
| MSS/3/4/5/16/2013 | IN/CPACCE යටලේ පුහුණු කරුවන් පුහුණු කිරීම | | | |

## 2013.01.01 දින සිට 2013.12.31 පුහුණු පාඨමාලා

| අනු අංකය | පුහුණු පාඨමාලාව | සහාභගිවූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව (Payroll) පුහුණුව | 02 |
| 02 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුහුණුව | 01 |
| 03 | පරිපාලන වෘත්තිකයන් සඳහා ව්‍යාපාරික ලේඛන පිළිබඳ දෙදින වැඩමුළුව | 01 |
| 04 | වාහන සංවිධාන පුහුණුව | 02 |
| 05 | රියදුරු මහතුන්ගේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය | 15 |
| 06 | උපදේශන ශ්‍රාසත්‍රපති උපාධිය හැදෑරීම. | 07 |
| 07 | රාජ්‍ය භාෂා දෙමළ හා ඉංග්‍රීසි පාඨමාලාව | 05 |

## අමාත්‍ය මණ්ඩල සංදේශ 2013

| අනු අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | දිනය | විෂය | තීරණ අංකය | තීරණ දිනය |
|---|---|---|---|---|---|
| 01. | MSS/CM/01/2013 | 2013.03.20 | මනෝ වික්ෂිපත්භාවය සහ ඒ හා සම්බන්ධ ආබාධ හේත2වෙන් තදබල ලෙස ආබාධිත තත්ත්වයට පත්ව ඇති දරැවන් සඛහා තදබල ලෙස ආබාධිත තත්ත්වයට පත්ව ඇති දරැවන් සඳහා නේවාසික සුරකුම් නිවාසයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන තවදුරටත් ලබාදීම | අමප 13/0232/534/001 | 2012.03.07 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02. | MSS/CM/03/2013 | 2013.05.07 | තෙළඹුයාය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පුළුල් කිරීම | අමප 13/0600/534/002 | 2013.05.21 |
| 03. | MSS/CM/04/2013 | 2013.05.07 | ස්වේච්ඡා සේවක තොරතුරු සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ව්‍යාපෘතිය දීර්ඝ කිරීම | අමප 13/0601/534/003 | 2013.05.21 |
| 04. | MSS/CM/05/2013 | 2013.05.31 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ පී.ඒ.ජී.ප්‍රනාන්දු මහත්මිය සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත්කිරීම | අමප 13/0715/534/004 | 2013.06.20 |
| 05. | MSS/CM/06/2013 | 2013.07.04 | පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) සඳහා වූ පනත් කෙටුම්පත | අමප 13/0934/534/005 | 2013.07.18 |
| 06 | MSS/CM/07/2013 | 2013.08.05 | පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) සඳහා වූ පනත් කෙටුම්පත | අමප 13/1121/534/006 | 2013.07.18 |
| 07 | MSS/CM/08/2013 | 20.09.2013 | ස්ථිර සේවයේ සිට තාවකාලික තනතුරක් සඳහා අනුයුක්ත කිරීම මතත ඉටු කළ සේවා කාලය විශ්‍රාම වැටුප් ගණයට ඇතුළත් කිරීම හා සේවයේ අවශ්‍යතාව මත අවු.60 දක්වා සේවයේ රඳවා ගැනීම - ඊ.ජේ.කේ.තිසිස් වීරසිංහ මහතා (මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරි III) | අමප 13/1416/534/007 | 2013.10.21 |
| 08 | MSS/CM/09/2013 | 2013.10.04 | සුදු සැරයටි සඳහා නෛතික රැකවරණය | අමප 13/1456/534/008 | 2013.10.17 |
| 09 | MSS/CM/10/2013 | 2013.10.09 | වැඩ බැලීමේ තනතුරට පත්කිරීම ශ්‍රී.ලං.ප.සේ. | අමප | 2013.11.11 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නිලධාරි අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය | 13/1521/534/004 | |
| 10 | MSS/CM/10/2013 | 2013.10.24 | ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියකාරි සැලැස්ම ක්‍රියාවට නැංවීම | අමප 13/1617/534/009 | 2013.12.16 |
| 10 | MSS/CM/12/2013 | 2013.11.20 | ආබාධිත සහ වැඩිහිටි ප්‍රජාවන්ගේ නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය | අමප 13/1702/534/010 | 2013.12.16 |
| 11 | MSS/CM/13/2013 | 2013.11.27 | වාර්ෂික වාර්තාව - 2011- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව | අමප 13/1759/534/011 | 2013.12.16 |
| 12 | MSS/CM/14/2013 | 2013.12.02 | පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - ලක්ෂ්මන් වසන්ත පෙරේරා පදනම (සංස්ථාගත කිරීමේ) සඳහා වූ පනත් කෙටුම්පත | අමප 13/1813/534/012 | 2014.01.03 |
| 13 | MSS/CM/15/2013 | 2013.12.18 | පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) සඳහා වූ පනත් කෙටුම්පත | අමප 13/1890/534/014 | 2014.01.13 |
| 14 | MSS/CM/16/2013 | 2013.12.27 | උපදේශකවරයෙකු ලෙස සේවය කරන කර්බි.එස්.ද ලැනරෝල් මහතාගේ සේවය දීර්ඝ කිරීම | අමප 13/1889/534/013 | 2014.01.13 |

# **02.** ආබාධ සහිත පුද්ගලයන් සභා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය.

**මෙහෙවර**

**"මාර්ගෝපදේශකත්වය , සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙයවීම තුළින් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා සුරක්ෂිතභාවය සහතික කිරීම"**

පරමාර්ථ :

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, වැඩිදියුණු කිරීම සහ සුරක්ෂිත කිරීම උදෙසා 1996 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පනවන ලද නීති ක්‍රියාත්මක කිරීම.

කාර්යයන් හා ක්‍රියාකාරකම් :

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම අභිසංවර්ධනය කිරීම, සහ ආරක්ෂා කිරීම, වග බලාගැනීම සඳහා 1996 අංක 28 දරණ පනත යටතේ අතිගරු ජනාධිපති තුමා විසින් ආබාධ සහිත තැනැත්තන් උදෙසා ජාතික සභාවක් මෙම අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇත. ඒ අනුව පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් මෙම ජාතික සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ.

- ආබාධ සහිත තැනැත්තන් සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.
- ආබාධ ඇති වීමේ ප්‍රධාන හේතු වැළැක්වීම හා පාලනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධව නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම.
- ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා පිහිටුවන ලද ආයතනය වල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම හා ආධාර දීම.

- ❖ ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයින්ට භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සකස් කිරීම,ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබාදීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සහ තත්වය පිළිබඳ ජනතාව ඇනුවත් කිරීම වැඩි දියුණු කිරීම.

**නීති සම්පාදනය :**

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ 1996 අංක 28 දරණ පනත සංශෝධනය කර නව පනතක් කෙටුම්පත් කර ඇති අතර එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර නිරීක්ෂණ ලබාගෙන ඇති අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ජාතික සභාව තීරණය කර ඇත.

## *මහින්ද චින්තන වැඩසටහන් යටතේ ආබාධ සහිත තැනැත්තන් සිටින පවුල් සඳහා රුපියල් 3000/- ක දීමනාව ලබාදීම.*

මහින්ද චින්තන වැඩසටහන යටතේ 2013 වර්ෂය සඳහා රු මිලියන 598 ක් වෙන් කරන ලද අතර, මෙයින් ආබාධ සහිත තැනැත්තන් සිටින දිළිඳු පවුල් 16600 ක් සඳහා මසකට රු.3000/- බැගින් ජීවනාධාර ලබාදීමට හැකිවී ඇත. ඒ අනුව 2013 දෙසැම්බර් අවසාන වන විට ලබාදී ඇති මුළු මුදල රු.මි.598 කි.

**ජංගම සේවා හා අධාරක උපකරණ නිකුත් කිරීම.**

| ආධාරක උපකරණ වර්ග | සංඛ්‍යාව |
|---|---|
| රෝද පුටු | 771 |
| කිහිලිකරු | 306 |
| අත්වාරු | 306 |
| ළඟ පමණක් පෙනෙන ඇස් කණ්නාඩි | 93397 |
| ත්‍රෛසිකල් | 20 |
| කොමඩ් සහිත රෝද පුටු | 53 |
| ශ්‍රවණ උපකරණ | 22 |

2013 දෙසැම්බර් වන විට ජංගම සේවා 168 ක් පවත්වා ඇති අතර ආධාරක උපකරණ සඳහා රු.මිලියන 24.63 මුදලක් වැය කර ඇත.

### *නිවාස වැඩසටහන*

එක් නිවාසයක් සඳහා රු.250,000/- ක් ලබාදීමට කටයුතු කරන අතර 2013 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට රු.මිලියන 73.28 ක් මේ සඳහා වැය කරමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස අළුත්වැඩියා කිරීමටත්, ඉදිකිරීමටත් නිවාස 599 ක් සඳහා ලබාදී ඇත.

| මාසය | ආධාර ලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 08 |
| පෙබරවාරි | 65 |
| මාර්තු | 69 |
| අප්‍රේල් | – |
| මැයි | 201 |
| ජූනි | 64 |
| ජූලි | 09 |
| අගෝස්තු | – |
| සැප්තැම්බර් | – |
| ඔක්තෝබර් | – |
| නොවැම්බර් | 116 |
| දෙසැම්බර් | 67 |
| **එකතුව** | **599** |

### *ප්‍රවේශ පහසුකම් වැඩසටහන් :*

රජයේ ගොඩනැගිලි සහ පොදු ගොඩනැගිලි සඳහා ප්‍රවේශ පහසුකම් ලබාදීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන 2013 දෙසැම්බර් මස වනවිට වව්නියාව, යාපනය,මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රක්කයන්හි පවත්වන ලද අතර මේ සඳහා ඒ ඒ දිස්ත්‍රක්කයන්හි ප්‍රාදේශීය ලේකම්වරු සමාජ සේවා නිලධාරීන් හා කාර්මික නිලධාරීන් සහභාගී වූහ. 2013 දෙසැම්බර් මස වන විට පහත සඳහන් ස්ථාන සඳහා ප්‍රවේශ පහසුකම් ලබාදීමට කටයුතු කරන ලදි.

**ප්‍රවේශ පහසුකම් - 2013**

| දිස්ත්‍රික්කය | ස්ථානය/ප්‍රා.ලේ.කොට්ඨාශය | මුදල |
|---|---|---|
| පොළොන්නරුව | මැදිරිගිරිය | 217,338.47 |
| | පොළොන්නරුව | 321,024.70 |
| අම්පාර | කල්මුණේ | 60,795.00 |
| පොළොන්නරුව | පොළොන්නරුව දි/ලේ | 156,958.00 |
| | ඇළහැර ප්‍රා/ ලේ | 28,187.20 |
| බදුල්ල | වැලිමඩ ප්‍රා/ලේ | 7,050.00 |
| ගම්පහ | මීරිගම | 45,330.00 |

| දිස්ත්‍රික්කය | ස්ථානය/ප්‍රා.ලේ.කොට්ඨාශය | මුදල |
|---|---|---|
| වැලිමඩ | බදුල්ල | 7,050.00 |
| මීරිගම | ගම්පහ | 45,330.00 |
| වරකාපොල | කෑගල්ල | 105,121.00 |
| තඹුත්තේගම | අනුරාධපුර | 21,122.00 |
| බඩල්කුඹුර | මොනරාගල | 50,000.00 |
| මන්මුනෙයි උතුර | මඩකලපුව | 250,000.00 |
| මුන්දලම | පුත්තලම | 12,778.01 |
| කන්දාවලෙයි | කිලිනොච්චිය | 73,000.00 |
| වලල්ලාවිට | කළුතර | 45,000.00 |
| මැදිරිගිරිය | පොළොන්නරුව | 98,436.37 |
| මැදිරිගිරිය | පොළොන්නරුව | 21,665.73 |
| ලංකාපුර | පොළොන්නරුව | 6,418.26 |
| පේදුරු තුඩුව | යාපනය | 120,000.00 |
| මූන්දලම | පුත්තලම | 88,948.29 |
| බලන්ගොඩ | රත්නපුර | 50,000.00 |
| | එකතුව | 1,831,553.03 |

***අන්තර් අමාත්‍යාංශ කමිටුව :***

ප්‍රවේශ නියෝග පිළිබඳ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,පළාත් පාලන ආයතන ලේකම්වරුන්, පළාත් පාලන ලේකම්වරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කඅරීමට කටයුතු යොදා ඇති අතර ප්‍රවේශ පහසුකම් ලබාදීම සම්බන්ධව තාක්ෂණික උපදෙස් ලබාදීමත් එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් ක්‍රියාත්මක වේ.

***ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීමේ වැඩසටහන - උපරිමය රු.25,000/-***

2013 දෙසැම්බර් වන විට ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර 371 ක් ලබාදී ඇති අතර, ඒ සඳහා වැයකොට ඇති මුදල රුපියල් මිලියන 7.6 කි.

| මාසය | ආධාර ලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 10 |
| පෙබරවාරි | 82 |
| මාර්තු | 31 |
| අප්‍රේල් | 60 |
| මැයි | 56 |
| ජුනි | 81 |
| ජූලි | 10 |
| අගෝස්තු | 04 |
| සැප්තැම්බර් | - |
| ඔක්තෝබර් | 10 |
| නොවැම්බර් | 08 |
| දෙසැම්බර් | 19 |
| **එකතුව** | **371** |

***රෝගීන් සඳහා වෛද්‍යාධාර ලබාදීමේ වැඩසටහන - උපරිමය රු.20,000/-***

2013 සැප්තැම්බර් වන විට රු.මිලියන 6.7 ක් රෝගී පුද්ගලයින් 434 දෙනෙක් සඳහා ලබාදී ඇත. හදවත් සැත්කම්, වකුගඩු බද්ධ කිරීම්, උකුල් ඇට බද්ධ කිරීම්, දණිස් කටු බද්ධ කිරීම්, කර්ණ පටක සැත්කම් මෙන්ම ඖෂධ ලබාගැනීම සඳහා මේ යටතේ ආධාර දෙනු ලැබේ.

| මාසය | ආධාරලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | - |
| පෙබරවාරි | 18 |
| මාර්තු | 51 |
| අප්‍රේල් | 74 |
| මැයි | 74 |
| ජුනි | 31 |
| ජූලි | 24 |
| අගෝස්තු | 11 |
| සැප්තැම්බර් | 30 |
| ඔක්තෝබර් | 33 |
| නොවැම්බර් | 18 |
| දෙසැම්බර් | 70 |
| **එකතුව** | **434** |

***ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපන ආධාර :***

2013 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ආබාධ සහිත දරුවන් 246 දෙනෙකු වෙනුවෙන් අධ්‍යාපන ආධාර වශයෙන් රු.මි.1.27 ක් ලබාදී ඇත.

***බ්‍රේල් ක්‍රම විද්‍යාව, සංඥා භාෂාව, චලතාවය හා දිශානතිය පිළිබඳ පාඨමාලා :***

I. විවිධ අමාත්‍යාංශ වල රාජ්‍ය නිලධාරීන් හා ස්වේච්ඡා සංවිධාන නියෝජිතයින් 43 දෙනෙකු සඳහා 2013 පෙබරවාරි 18 දින පාඨමාලා දෙකක් ආරම්භ කර ඇති අතර මෙම පාඨමාලා 2013 දෙසැම්බර් මස අවසන් කර ඇත.

II. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් 28 දෙනෙකු සඳහා 2013 මැයි 05 දින පාඨමාලාවක් ආරම්භකර ඇති අතර මෙය 2013 දෙසැම්බර් මස අවසන් කර ඇත.

III. 2013 පෙබරවාරි මාසයේදී වයඹ පළාත් සමාජ සේවා නිලධාරීන් 51 දෙනෙකු සඳහා පාඨමාලාවක් ආරම්භ කර ඇති අතර එය 2013 ජූලි මස අවසන් කර ඇත. මෙම පාඨමාලා සඳහා බ්‍රේල් ක්‍රම විද්‍යාව, සංඥා භාෂාව, චලතාවය හා දිශානතිය යන පාඨමාලා තුනම ඇතුලත් වේ.

මෙයට අමතර වශයෙන් පහත සඳහන් සේවාවන් ලබාදීමට කටයුතු කෙරේ.

I. රජයේ පාසල් වල ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත සිසුන්ගේ ප්‍රශ්න පත්‍ර හා උත්තර පත්‍ර බ්‍රේල් ක්‍රම විද්‍යාවට අනුව පරිවර්ථනය කිරීමට කටයුතු කිරීම.

II. ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්තා බ්‍රේල් ක්‍රම විද්‍යාවට පරිවර්ථනය කිරීම.

III. උසස් පෙළ විභාගයට පෙනී සිටින දෘශ්‍යාබාධිත සිසුන් සඳහා අධ්‍යාපන පහසුකම් ලබාදීම.

***ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම :***

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20 වන වගන්තිය යටතේ ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධව කටයුතු කරන පහත සඳහන් ස්වේච්ඡා සංවිධාන 2013 වර්ෂය තුලදී ලියාපදිංචි කර ඇත.

| | |
|---|---|
| Aloka Skills Development Foundation For Disabled Youth | නො.41/4, ජාවත්ත පාර, කොළඹ 5. |
| කේ.ඒ.කුලරත්න පදනම | නො.28/86,රෝයල් පාර්ක්,සපුගස්තැන්න පාර,කළගෙඩිහේන. |
| එක්සත් ප්‍රජා සහයෝගිතා මධ්‍යස්ථානය | නො.288/4,සිංහපුර,වක්වැල්ල,ගාල්ල. |
| අපේක්ෂා හෝම්ස් | උස්වැටකෙයියාව,රූද්‍රිගු මාවතේ නො.74 හා උස්වැටකෙයියාව නො.46. |
| බස්නාහිර පලාත් බිහිරි සංගමය | නො.60,දෙවන මහල,මධ්‍යම වෙළඳ සංකීර්ණය,දුම්රියපොළ පාර,දෙහිවල. |

| | |
|---|---|
| ග්‍රීන් ෆ්ලවර්ස්, ශ්‍රීලංකා | නො 05, හරස් පාර, සමන්තුරෙයි |
| Vanni Rehabilitation Organization For the Differently Abled | 04 වන කණුව, මන්නාරම් පාර,රම්බෙයි මඩු, වවුනියාව |
| දිමුතු සැනසුම් සේවාව | කොළඹ පාර,පම්බල,කාක්කපල්ලිය. |
| Community Business And Technogy Developers (GTE)LTD | 11, 1 වන පටුමග, ලිනිගනගර්, ත්‍රිකුණාමලය |
| Self Help Group For Disabled | 79/1 " මූත විනයගර් පාර,නල්ලූර්, යාපනය |
| සුමඟ රුහුණු ශ්‍රවණ ඌනතා සංසදය | නො.143,ගාලුපාර,වල්ගම,මාතර. |
| මිරුනිඩා හේමලතා කලා ආශ්‍රමය | නො.189,පරණ පාර,නාවින්න,මහරගම. |
| සහනෝද පදනම | 341/9,වක්වැල්ල හරහා ගාල්ල. |
| We are Family foundation | අංක 9, ධර්මාශ්‍රීම මාවත, බොරුපන රත්මලාන |
| CEREBRAL POLSY Lanka Fonundation | NO 127,5/4 st James Street.Clombo 15 |

***වික්ටෝරියා නිවාස ආධාර සඳහා ආධාර :***

සුවකළ නොහැකි රෝගීන් සඳහා වන රාජගිරිය වික්ටෝරියා නිවාසය සඳහා 2013 වර්ෂයට රු.මිලියන 6.0 ක මුදලක් වෙන් කරනු ලැබ ඇත. මේ අනුව මසකට රු.500,000.00 බැගින් මේ දක්වා වික්ටෝරියා නිවාසයේ වියදම් සඳහා මුදල් ලබා දීමට කටයුතු කර ඇත.

***වසරේ සුවිශේෂී ජයග්‍රහණ :***

- සංඥා භාෂාව අමාත්‍ය මණ්ඩලය විසින් පිළිගනු ලැබීමෙන් අනතුරුව ගරු ෆීලික්ස් පෙරේරා සමාජ සේවා අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පනත් කෙටුම්පත් සකස්කොට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

- අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් හා ගරු සමාජ සේවා අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ ඔටිසම් හෙවත් මනෝවික්ෂිප්තභාවය සහිත දරුවන් නගාලීම සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය හා ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය හා ඒකාබද්ධ විශේෂ වැඩසටහන් සැලසුම් කර ඇත. මේ පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම දැනටමත් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. මේ වනවිට මෙම දරුවන් හඳුනාගැනීම සඳහා බස්නාහිර පළාතේ ක්ෂේත්‍ර නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදෙමින් පවතී.

- ආබාධ සහිත ප්‍රජාවට ප්‍රවේශ පහසුකම් සැලසීම පිළිබඳ 2006 අංක 01 ප්‍රවේශ නියෝග යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ දීර්ඝ වශයෙන් කරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක්

වශයෙන් ආබාධ සහිත අයට පහසුකම් ඇති ලංගම බස් රථ කීපයක් ප්‍රධාන මාර්ගයන්හි ධාවනයට එක් කිරීමට අවකාශ සැලසී තිබේ. එසේම අලුතින් ඉදිකරන උතුරු හා මන්නාරම දුම්රිය මාර්ගයේ සියලු දුම්රිය ස්ථාන ප්‍රවේශ පහසුකම් සහිතව ඉදිකිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පියවර ගනිමින් තිබේ.

❖ **ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැළැස්ම.**

මෙම සැළැස්ම සඳහා ජාතික සභාවේ අනුමැතිය අනුව සිංහල හා දමිළ භාෂාවට පරිවර්තනය කෙරෙමින් පවතින අතර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

❖ **සුදු සැරයටි සඳහා නෛතික රැකවරණය.**

සුදු සැරයටිය භාවිතා කරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම,ප්‍රවර්ධනය හා අභිසංවර්ධනය සඳහා සකස් කරනු ලබන මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සැළසුම්කර ඇත.

# 03. ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩ සටහන - C B R

**අරමුණ**

**ආබාධ සහිත පුද්ගලයින් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට හා වගකීම් ඉටු කිරීමට හැකිවීම පිණිස සංවර්ධනය කිරීම, ඔවුනට සම අවස්ථා සලසා දීම සඳහා ඔවුන් සමාජයට ඒකීකරණය කිරීම පිණිස , දැනට පවත්නා වූ සමාජ සංවර්ධන වැඩ සටහන් තුල අවස්ථා ඇති කිරීම.**

**පසුබිම**

ආබාධ සහිත පුද්ගලයින් ද සමාජයේ සම සාමාජිකයින් වන අතර, ඔවුන් අයත් ප්‍රජාවන් තුල ඔවුනට සමාන අයිතීන් ලැබිය යුතු මෙන්ම ඔවුනට අවශ්‍යවන්නා වූ අනුබලයන් වන පොදු අධ්‍යාපන, සෞඛ්‍ය, රැකී රක්ෂා, ප්‍රවේශ පහසුකම්, සුබසාධන හා වෙනත් ඕනෑම අවශ්‍යතාවයක් පවතින ව්‍යුහයන් තුලින්ම අනෙකුත් අයට හා සමාන ලෙස සැපයිය යුතුය යන්න ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් සමසහජීවනය සඳහා වූ අයිතිවාසිකමයි. සමාජ සේවා අමාත්‍යාංශය දැනට දිවයින පුරා දිස්ත්‍රික්ක 25 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 තුල වැඩ සටහන් ක්‍රියාත්මක කරයි. ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන මෙම සම සහජීවනය සඳහා වූ අයිතිය ආරක්ෂා කරන්නා වූද, තහවුරු කරන්නා වූද සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛ සංවර්ධන වැඩ සටහනක් ලෙස හඳුන්වා දිය හැකිය.

ආබාධ සහිත සියලු පුද්ගලයින් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට හා වගකීම් ඉටු කිරීමට හැකිවීම පිණිස සංවර්ධනය කිරීම, ඔවුන්ට සම අවස්ථා සලසා දීම හා ඔවුන් සමාජයට ඒකීකරණය කිරීම පිණිස ප්‍රජා සංවර්ධනය තුල ගැබ්වුන ක්‍රියාවලිය ප්‍රජා මූලික පුනරුත්ථාපනය ලෙස අර්ථ දැක්විය හැක. මෙම වැඩ සටහනේදී ජාතික, පළාත්. දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් විවිධ මට්ටම් වලදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුත්, විවිධ රාජ්‍ය නොවන සංවිධාන හා සම්පත් පුද්ගලයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටු ස්ථාපිත කර ඇති අතර, ආබාධ සහිත පුද්ගලයා හා එම පවුල්වල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය හා දිස්ත්‍රිත් ස්වශක්ති සංවිධාන පිහිටුවා ඔවුන් බලගැන්වීම කළ යුතුය.

සියලුම අංශ තුල මානව සම්පත සංවර්ධනය හා ඍණාත්මක ආකල්ප වෙනස් කිරිම සදහා කටයුතු කළ යුතුය.

<u>ක්‍රියාකාරකම්</u>

1. ආබාධ සහිත පුද්ගලයින් සහ එම පවුල්වල මානව සම්පත දැනුමෙන් ආකල්පවලින් හා ක්‍රියාකාරකම්වලින් සංවර්ධනය කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
2. නිවස, සමාජය, පෙරපාසල්, පාසල , විශ්ව විද්‍යාලය, සේවා ස්ථාන තුල ස්වාධීන පුද්ගලයෙකු ලෙසට කටයුතු කිරීම සඳහා දෛනික ක්‍රියාකාරකම් පුහුණුව.
3. අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය තුල හෝ විශේෂ අධ්‍යාපන ක්‍රමය තුලින් මෙම ආබාධ සහිත දරුවන්ට අධ්‍යාපන අවස්ථා ලැබීම සඳහා යොමු කිරීම ඇතුලු අනෙකුත් සේවාවන් සඳහා යොමු කිරීම.
4. ආර්ථිකය සවිබලගැන්වීම සඳහා කම්කරු අමාත්‍යාංශය හා පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව රැකියා අවස්ථා ලබාදීම හා රැකියාවන් සඳහා පූර්ව සූදානම් කිරීම.
5. ප්‍රාදේශීය මට්ටමේ හෝ ජාතික මට්ටමේ වෘත්තීය පුහුණු ආයතන හරහා වෘත්තීය පුහුණුව ලබාදීමට කටයුතු කිරීම.
6. අනෙකුත් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තුවල පවතින වැඩ සටහන්වලට ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය කිරීම. - දිවිනැගුම,ක්‍රීඩා .සංස්කෘතික වැනි
7. විවිධ සාමාජීය ආගමික - සංස්කෘතික වැඩ සටහන්වලට සක්‍රිය ලෙස සහභාගි කරවීම.

**මේ සඳහා යොදාගනු ලබන ක්‍රම ශිල්ප**

- අන්තර් අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන සංවිධාන වලින් සැදුම්ලත් ජාතික මෙහෙයුම් කමිටු යාවත්කාලීන කිරීම.
- ජාතික මෙහෙයුම් කමිටුවේදී ගනු ලැබූ තීරණයන්ට අනුව සී.බී.ආර්. වැඩ සටහන සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම.
- සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් කමිටු පවත්වා ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම යාවත්කාලීන කිරීම.
- සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සේවය කරන සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාරවරුන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් යන නිලධාරීන් සඳහා

සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි වාර්තාකරණය හා සටහන් තැබීම පිළිබඳවත් සී.බී.ආර්. වැඩ සටහනේ නව ප්‍රවනතා පිළිබඳවත් වැඩමුලු පැවැත්වීම.

- ප්‍රාදේශීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා අන්තර්කරණ වැඩමුළු පැවැත්වීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාමීය නායකයින් සඳහා වැඩමුළු පැවැත්වීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගෙන් සැදුම්ලත් ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- අබාධ සහිත පුද්ගල දෙමාපිය සංවිධාන පිහිටුවීම හා දැනුවත් කිරීම.
- ස්වේච්ඡා සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම.
- පළාත් සහායක නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩමුලු හා මාසික ප්‍රගති වාර්තා ලබා ගැනීම හා සමාලෝචනය.
- රැකියා වෙළඳපොලවල් පැවැත්වීම

| සී.බී.ආර්. වැඩ සටහන - 2013<br>භෞතික ප්‍රගතිය | | |
|---|---|---|
| 1. | නිවෙස් මට්මමේ පුනරුත්ථාපනය | 6427 |
| 2. | සමාජගත කිරීම් | 1414 |
| 3. | පෙරපාසල් වෙත යොමු කළ සංඛ්‍යාව | 1143 |
| 4. | සාමාන්‍ය පාසල් වෙත යොමු කළ සංඛ්‍යාව | 727 |
| 5. | විශේෂ පාසල් වෙත යොමු කළ සංඛ්‍යාව | 991 |
| 6. | චිකිත්සක සේවා සඳහා යොමු කිරීම් | 4623 |
| 7. | වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම් | 1339 |
| 8. | රැකියා සඳහා යොමු කිරීම් | 643 |
| 9. | ස්වයං රැකියා සඳහා යොමු කිරීම් | 2725 |
| 10 | සෘජු ප්‍රතිලාභ ලබාදුන් සංඛ්‍යාව | 114 |
| 11 | දිස්ත්‍රික් ස්වශක්ති කණ්ඩායම් බලගැන්වීම් | 17 |

# 04. උපදේශන අංශය

**අපගේ දැක්ම**

**සමබර පෞරුෂයකින් යුත් නිරෝගී ජාතියක්**

**අපගේ මෙහෙවර**

**මනෝ විද්‍යාත්මක ක්‍රමවේද මගින් පුද්ගල පෞරුෂ සංවර්ධනය, අසමතුලිත මානසික තත්ත්වයන් වැළැක්වීම , ආයතන සම්න්ධීකරණය, නායකත්වය ලබා දීම , දැනුවත් කිරීම හා උපදේශන අවශ්‍යතා සැපයී මගින් මානසික සෞඛ්‍ය ඉහළ නංවා සෑම පුරවැසියෙක්ම ලංකාවේ ජාතික සංවර්ධනයට දායක කරවීම අපගේ මෙහෙවර වේ.**

මෙම මෙහෙවර ළගා කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ උපදේශන අංශය ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්තව උපදේශන සහකාර නිලධාරීන් 180 දෙනෙකු සේවය කරනු ලැබේ.

**උපදේශන අංශය සතු කාර්යභාරය**

- උපදේශන සේවා සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම
- උපදේශන සේවා සම්බන්ධයෙන් ප්‍රමිතීන් සකස් කිරිම
- උපදේශන ක්ෂේත්‍රෙය් මානව සම්පත් දියුණු කිරිම
- උපදේශන සේවා සපයන රාජ්‍ය රාජ්‍ය නොව ආයතන සම්බන්ධීකරණ ය කිරිම (ජාතික උපදේශන සේවා දිනය ඔක්තෝබර් 15)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් උපදේශන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම හා උපදේශකවරුන් සේවයේ යෙදවීම
- උපදේශනය, මනෝ ප්‍රතිකාර හා එහි ප්‍රතිලාභ පිළිබඳව රාජ්‍ය නිලධාරින්, ප්‍රජා නායකයින් , පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගුරුවරුන් දැනුවත් කිරීම තුළින් උපදේශන සේවා ව්‍යාප්ත කිරිම
- ස්වාභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ව්‍යනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා ව්‍යසන උපදේශන සායන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- උපදේශනය මනෝ ප්‍රතිකාර හා එහි ප්‍රතිලාභ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරිමේ ප්‍රකාශන නිකුත් කිරීම (සිංහල හා දෙමළ මාධ්‍ය)
- මනෝ සමාජීය ගැටලු අවම කිරීම සඳහා සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීම
- 24 පැය ජංගම දුරකතන උපදේශන සේවා මගින් දිවයින පුරා සිටින උපදේශන නිලධාරීන් ප්‍රජාව හා සම්බන්ධ කිරීම
- ස්වේච්ඡා සේවකයින් සක්‍රිය සවන්දෙන්නන් , මනෝ සමාජීය වැඩකරුවන් ලෙස පුහුණු කර ප්‍රජා සේවා සඳහා සම්බන්ධ කිරීම
- උපදේශනය පිළිබඳ කෙටිකාලීන කුසලතා පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- රාජ්‍ය ආයතනවලට ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට පුහුණු උපදේශකවරුන්ගේ සේවය ලබා දීම (රෝහල්, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන්සේවා සමාගම)

## 2013 වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම්

### 1. ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් ප්‍රතිකාරාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

i. රාජ්‍ය නිලධාරීන් උපදේශනය පිළිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන් 20 ක් දිස්ත්‍රික්ක 21 ක පැවැත්වීම

ii. ප්‍රාදේශීය මට්ටමේ උපදේශන නිලධාරින්ගේ ව්‍යාපෘති යෝජනා සඳහා තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ප්‍රතිපාදන ලබාදීම

iii. කන්දකාඩු මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ රැඳවියන් සඳහා උපදේශන සේවා ලබාදීම

iv. අනුරාධපුර අභිමංසල පූර්ණකාලීන ආබාධිත හමුදා සෙබලුන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ මනෝ කායික පුනරුත්ථාපන උපදේශන සහාය වැඩසටහන් පැවැත්වීම

v. ප්‍රාදේශීය මට්ටමේ උපදේශන නිලධාරීන් විසින් අධ්‍යාපන (පාසල්, පෙරපාසල්, දහම්පාසල්) , පවුල් ( විවාහපූර්ව, විවාහ, ගර්භණී) , වැඩිහිටි හා යෞවන , මත්ද්‍රව්‍ය නිවාරණාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

## 2. ධාරිතා සංවර්ධන වැඩසටහන්

i. උපදේශන සහකාර නිලධාරීන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් 03ක් පැවැත්වීම
ii. සංවර්ධන නිලධාරි (උපදේශන) නිලධාරින් සඳහා සේවාරම්භක හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
iii. උපදේශන සහකාර / සංවර්ධන නිලධාරි ( උපදේශන) සඳහා ප්‍රගිත සමාලෝචන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
iv. රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් සක්‍රීය සවන්දෙන්නන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් 50ක් සඳහා ප්‍රතිපාදන ලබාදීම
v. රාජ්‍ය ආයතනයන්ගේ ඉල්ලීම් අනුව විශේෂ සුබෝධ්‍යා උපදේශන සංවාද වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

## 3. 24 පැය ජංගම දුරකථන උපදේශන සේවා සැපයීම

i. ඩයලොග් ජංගම දුරකථන ජාලය ඔස්සේ උපදේශන නිලධාරීන් 100 දෙනෙකු හරහා ප්‍රජාවගේ මානසික ප්‍රශ්න හා ගැටලු නිරාකරණය සඳහා උපදේශන සහාය ලබාදීම

## 4. ප්‍රකාශන හා මුද්‍රණ

i. උපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ අත්පත්‍රිකා වර්ග 3 ක පිටපත් 40000 ක් මුද්‍රණය කිරීම
ii. උපදේශන දින සගරාව එළි දැක්වීම
iii. ජාතික උපදේශන සේවා දිනය නිමිත්තෙන් බැනර නිර්මාණය කිරීම

## 5. ජාතික උපදේශන සේවා දිනයට සමගාමීව උපදේශන දිනයට සමගාමීව උපදේශන වැඩටසහන් ක්‍රියාත්මක කිරීම

i. වැඩිහිටි මානසික සෞඛ්‍යය උදෙසා උපදේශනය යන්න තේමා කරගනිමින් ජාතික උපදේශන සේවා දින සැමරුම් උත්සවය ශ්‍රීලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේ දී 2013 ඔක්තෝබර් 14 වන දින රාජ්‍ය හා රාජ්‍ය නොවන උපදේශ සේවා සපයන ආයතන ඒකරාශී කරමින් පැවැත්වීම

## 6. උතුරු නැගෙනහිර පළාත්හි යුනිසෙෆ් ව්‍යාපෘතිය යටතේ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

i. යුනිසෙෆ් මූල්‍යමය ආධාර යටතේ වවුනියාව, කිළිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්කයන්හි නැවත පදිංචිකිරිම් කරනු ලැබූ පෙදෙස්වල ප්‍රජාව , පාසල් දරුවන් , රාජ්‍ය නිලධාරින් ඉලක්ක කර ගනිමින් උපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් , සායන තාවකාලිකව අනුයුක්ත කර ඇති උපදේශන හා මනෝ සමාජීය වැඩකරුවන් හරහා ක්‍රියාත්මක කිරිම
ii. සක්‍රීය සවන්දෙන්නන් ලෙස ප්‍රජාව, රාජ්‍ය නිලධරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2013**

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන් හා සායන (ජාතික හා ප්‍රාදේශීය මට්ටම) | වැඩසටහන් 128 | 2.323 | 11930 |
| 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව | මාසික දුරකථන බිල්පත් 96 | 0.15 | 2976 |
| ධාරිතා සංවර්ධන උපදේශන වැඩසටහන් | වැඩසටහන් 61 | 5.37 | 2763 |
| ප්‍රකාශන | අත් පත්‍රිකා 55000 | 0.7 | - |
| උපදේශන සේවා සපයන ආයතන සම්බන්ධීකරණය | වැඩසටහන් 11 | 0.5325 | 154 |
| ඉදිකිරීම්/ අලුත්වැඩියා/භාණ්ඩ උපකරණ ලබා දීම | ඉදිකිරීම් 01<br>අලුත්වැඩියා 10<br>උපකරණ ලබාදීම් 13 | 2.9245 | - |

# 05. තනි මා-පිය පවුල් සංවර්ධන වැඩසටහන

## අරමුණ

**වර්තමාන සමාජයේ තනි මාපියන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීමත් ආර්ථික දරිද්‍රතාවය හේතු කොට ගෙන දරුවන්හට පාසල් අධ්‍යාපනය අහිමි වීමත් සුලබ ලක්ෂණයක්ව පවතී. කලත්‍රයා අතහැර දැමීම හේතු කොට ගෙනද කලත්‍රයා දිවියෙන් සමුගැනීම හේතු කොට ගෙනද, තනි මාපියන් බවට පත් වන දිළිඳු ශ්‍රී ලාංකීය පුරවැසියන්හට ඔවුන් මුහුණ දෙන ආර්ථික අපහසුතාවයන් සඳහා යම් පිටුවහලක් වෙමින් එම පවුල් මෙම සමාජ තලයේ ඉහල මට්ටමකට ඔසවා තබන්නට අත්වැලක් වීම මෙම වැඩ සටහනේ අරමුණයි.**

## ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී

1. ත්‍රස්තවාදී ක්‍රියා, වාර්ගික යුධ තත්වය, හදිසි අනතුරු, සියදිවි නසා ගැනීම් සහ එවැනි සිද්ධීන් නිසා තම සැමියාගේ අකල් වියෝවෙන් අසරණ තත්වයට පත්වූ කිරි බොන දරුවන්, කුඩා ළමුන්, පාසල් යන වයසේ දරුවන් සිටින කාන්තාවන් සඳහාද

2. සැමියා විසින් බිරිද හා දරුවන් අතහැරයාම හෝ බිරිද විසින් දරුවන් සමග සැමියා අතහැර ගිය පවුල් සඳහාද

3. නීතිමය විවාහයකට ඇතුලත් නොවූ එහෙත් අධ්‍යාපනය ලබන හා කුඩා දරුවන්, කිරි බොන දරුවන් සිටින එම දරුවන්ගේ අවශතාවයන් සපුරාලීම සඳහා කිසිම ආදායම් මාර්ගයක් නොමැති දරුවන් සමග හුදකලාව සිටින කාන්තාවන් සඳහාද ප්‍රමුඛත්වය ලැබෙනු ඇත.

2001 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්ථමේන්තුවේ දත්ත අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 18 ක තනි මා-පිය පවුල් 209,839 ක් සිටින අතර ඉන් වැඩිම සංඛ්‍යාවක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත.මෙම තනි මා-පිය පවුල් අතරින් වඩාත් අසරණ භාවයට පත්වන්නන් අතර කුඩා දරුවන් හා කාන්තාවන් සුවිශේෂය. මෙම අසරණ භාවය නිසාම ඔවුන්ගේ රැකවරණයට,ආරක්ෂාවට හා අභිමානයට බලවත් තර්ජනයක් එල්ලවී ඇත. මීට අමතර වශයෙන් දරුවන්ගේ අධ්‍යාපනය හා පෝෂණය ගැටළුවක් වී ඇති අතර ඔවුන් විවිධ වූ සමාජ අපචාර සඳහා ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවයක්ද පවති.

තවද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරන ලද සමීක්ෂණයකට අනුව පාසැල් යායුතු වයසේ සිටින දරුවන්ගෙන් 2% ක් පාසල් නොයන බව අනාවරණය වී ඇත. එයට ප්‍රධාන හේතුව ලෙස දක්වා ඇත්තේ ආර්ථික දරිද්‍රතාවයයි. මෙම කොටසින් සැලකිය යුතු කොටසක් තනි මාං-පිය පවුල් ගනයට ඇතුලත්වේ.

මෙම තත්වය අවම කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම වැඩ සටහන මගින් මෙහෙයවනු ලබයි.

1. තනි මාපිය පවුල් සංවර්ධනය සඳහා ආධාර ලබා දී ස්වයං රැකියා සඳහා ආරම්භ කිරීම හා පසු විපරම

2. කුඩා කංඩායම් වශයෙන් ඒකරාශී වී කරනු ලබන ආදායම් උත්පාදන වැඩ සටහන් සඳහා පුහුණුව හා ස්වයං රැකියා ආධාර ලබා දී ආදායම් උත්පාදන ආරම්භ කිරීම හා පසු විපරම් කිරීම.

3. තනි මාපිය පවුල්වල මවුවරුන් / පියවරුන්ගේ ආර්ථික ශක්තිය දියුණු කිරීම, පවුලේ අභිවෘද්ධිය සඳහා ඉටු විය යුතු කාර්යභාරය හා සමාජමය වගකීම පිළිබඳව ඔවුන්ව දැනුවත් කර ඔවුන්ගේ ආර්ථික තත්වය නගා සිටුවා දරුවන්ගේ අධ්‍යාපනය අඛංඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම, ඔවුන් විසින් ආරම්භ කරනු ලබන ව්‍යාපෘතින් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම හා හඳුනාගෙන ඇති අවදානම් සහිත පවුල් සංස්ථා ස්ථාවර කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

## 4. භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2013 දෙසැම්බර් 30 දක්වා

| වැඩ සටහන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මූල්‍යමය ප්‍රතිපාදන |
|---|---|---|
| 1. තනි මාං-පිය පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම<br>උදා - සතුන් ඇති කිරීම, එළවළු වගා කිරීම, ඇඳුම් මැසීම, ජංගම වෙළඳාම , සිල්ලර වෙළඳාම, ආහාර වර්ග නිෂ්පාදනය හා අලවිය ආදී ව්‍යාපෘති සඳහා | පවුල් සංඛ්‍යාව - 621 | 5875000.00/- |

| | | |
|---|---|---|
| 2. තනි මා-පිය පවුල් කුඩා කංඩායම් ස්වයං රැකියා සංවර්ධන වැඩසටහන්<br>උදා - පුද්ගල කණ්ඩායම් ලෙස ඒකරාශී වී ලුණු ඇඹරීම, ඇදුම් මැසීම ,තේ වගා කිරීම, රසකැවිළි නිෂ්පාදනය ආදී ව්‍යාපෘති සඳහා | වැඩ සටහන් - 18<br>පවුල් සංඛාව - 52 | 102,5000.00/- |
| 3. තනි මා-පිය පවුල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්<br>උදා -<br>❖ ව්‍යපෘතින් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම දැනුම ලබා දීම සඳහා පවත්වනු ලබන වැඩ සටහන් උදා - සපත්තු නිශ්පාදනය, යෝගට් නිෂ්පාදනය, අත්කම් භාන්ඩ නිෂ්පාදනය, රස කැවිලි නිශ්පාදනය<br>❖ හදුනාගෙන ඇති අවදානම් සහිත පවුල් සංස්ථා ස්ථාවර කිරීමේ වැඩ සටහන් උදා- පවුල් ආරවුල් ,දික්කසාද වීම් හේතුවෙන් පවුලට සිදුවන හානිකර තත්වය අවම කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>❖ පවුලේ අභිවෘද්ධිය සඳහා ඉටු විය යුතු කාර්යභාරය හා සමාජමය වගකීම පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩ සටහන් - 06<br>ප්‍රාදේශීයලේකම් කාර්යාල 6 ක<br>ප්‍රතිලාභීන් - 265 දෙනෙකු සඳහා | 100,000/- |
| **එකතුව** | | **7,000000/-** |

**2013 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය -රුපියල් මිලියන 7.00**

2013 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ස්වයං රැකියා ආධාර ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව

| අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගම්පහ | 80 |
| 02 | පුත්තලම | 26 |
| 03 | කොළඹ | 43 |
| 04 | ගාල්ල | 36 |
| 05 | රත්නපුර | 34 |
| 06 | කළුතර | 57 |
| 07 | පොළොන්නරුව | 14 |
| 08 | කෑගල්ල | 14 |
| 09 | අනුරාධපුර | 07 |
| 10 | කුරුණෑගල | 11 |
| 11 | මාතලේ | 02 |
| 12 | මාතර | 06 |
| 13 | මොණරාගල | 13 |
| 14 | හම්බන්තොට | 10 |
| 15 | අම්පාර | 71 |
| 16 | නුවරඑළිය | 10 |
| 17 | බදුල්ල | 09 |
| 18 | නුවර | 09 |
| 19 | යාපනය | 25 |
| 20 | මුලතිව් | 65 |
| 21 | මන්නාරම් | 72 |
| 22 | කිලිනොච්චි | 46 |
| 23 | වවුනියා | 08 |
| 24 | මඩකලපුව | 07 |
| මුළු එකතුව | | 675 |

**කුඩා කණ්ඩායම් ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ලබා දුන් ප්‍රතිපාදන - 2013**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය සිදුකරනු ලබන සමාජික සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|---|
| ගම්පහ | කටාන | ඇදුම් මසා අලවි කිරීම | 5 | 50,000/- |
| රත්නපුර | අයගම | තේ වගාව | 3 | 30.000/- |
| මොණරාගල | කතරගම | පූජා වට්ටි අලවිය | 4 | 40.000/- |
| කුරුණෑගල | මාස්පත | ඇදුම් මසා අලවි කිරීම | 3 | 30.000/- |
| බලපිටිය | මාතර | ලුණු ඇඹරීම | 10 | 150.000/- |
| යාපනය | කරවඩි | කිරි ගවයන් ඇති කිරීම | 4 | 40.000/- |
| යාපනය | චන්ගනායි | කුකුලන් ඇති කිරීම | 5 | 50.000/- |
| මුලතිව් | මාන්තිව්-දකුණ | කිරි ගවයන් ඇති කිරීම | 5 | 50.000/- |
| මන්නාරම් | නානාට්ටන් | කුකුලන් ඇති කිරීම | 7 | 70.000/- |
| මන්නාරම් | නානාටන් | කුකුලන් ඇති කිරීම | 6 | 60.000/- |

**තනි මාපිය පවුල් ස්වයං රැකියා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා ලබා දුන් ප්‍රතිපාදන - 2013**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|
| කළුතර | පානදුර | තාක්ෂණික හා වෘත්තීයමය දැනුම ලබා දීමේ වැඩ සටහන | 9500/- |

| | | | |
|---|---|---|---|
| මාතර | අකුරැස්ස | මානසික සෞඛ්‍ය සංවර්ධනය හා කුඩා කංඩායම් ව්‍යාපාති පිළිබඳව දැනුවත් කිරිමේ වැඩ සටහන් | 19,300/- |
| කළුතර | මතුගම | තාක්ෂණික හා වෘත්තීයමය දැනුම ලබා දීමේ වැඩ සටහන - පාවහන් නිෂ්පාදනය | 51.660/- |
| ගාල්ල | බලපිටිය | ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණික හා වෘත්තීයමය දැනුම ලබා දීමේ වැඩ සටහන | 5000/- |
| මාතර | වැලිපිටිය | තනි මාපිය පවුල් සාමාජිකයින්ගේ ආකල්ප වර්ධනය හා බිඳී යාමේ පවුල් ශක්තිමත් කිරීම සඳහා වැඩ සටහන | 10,000/- |

තනි මාපිය පවුල් ඒකකවල විරැකියාව අවම කර ඔවුන් ජාතික සංවර්ධනයේ හවුල් කරුවන් බවට පත් කර ගැනිම තුලින් සමාජයේ ප්‍රගමනයට දායක වන්නාවූ පුද්ගල පිරිසක් නිර්මාණය කිරිම මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම තුලින් සිදුවන මහගු සේවාවකි.

# 06. සිසුනැණ පුබුදුව වැඩසටහන

## *හැඳින්වීම*

ශ්‍රී ලාංකික දරුවන්ගේ පරිකල්පන ශක්තිය ක්‍රමයෙන් හීනවෙමින් පවතිනා බව දැනට කරන ලද පර්යේෂණ වලින් හෙළිවී ඇත. මෙම හේතුවෙන් සමාජ සාරධර්ම පිළිබඳව , හොඳ නරක පිළිබඳව, ආගම දහම පිළිබඳව තැකීමක් නොකරමින් විවිධ නපුරු බලවේගයන්හි ග්‍රහණයන්ට නතුවෙමින් හරිදේ කුමක් දැයි යන්න හරිහැටි වටහා ගත නොහැකිව අයාලේ යන තරුණ පරපුරක් දැනටමත් බිහිවී ඇත. සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය මඟින් කරන ලද සමීක්ෂණයකට අනුව මෙම තත්වයට පත්වීමට එක් හේතුවක් වී ඇත්තේ දරුවන් පොත් පත් කියවීමෙන් ඈත්වීම හේතුවෙන් බව හෙළිවී ඇත.

ඒ අනුව, දරුවන් කියවීම කෙරෙහි නැඹුරු කිරීම මඟින් දරුවන්ගේ පරිකල්පන ශක්තිය දියුණු කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය මඟින් සමාජ සංවර්ධන වැඩසටහනක් ලෙස සිසුනැණ පුබුදුව නමින් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී.

මේ මඟින් ලංකාවේ අඩු පහසුකම් වලින් යුක්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සුදුසු ග්‍රාම නිලධාරී වසමක් තෝරා එහි පදිංචි ස්වෙච්ඡාවෙන් කටයුතු කළ හැකි නායකයින් දස දෙනෙකු සඳහා දින දෙකක පුහුණුවක් ලබා දී රු.50,000/- ක් වටිනා පොත් කට්ටලයක් හා වානේ අල්මාරියක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

පාඨකයා රැගෙන යන පොත අනිවාර්යෙන්ම අවබෝධයෙන් යුතුව කියවීම සඳහා ක්‍රමවේදයක් සකසා තිබීම මෙහි විශේෂත්වයයි.

**<u>2013 වර්ෂයේ ආරම්භ කරන ලද මධ්‍යස්ථාන</u>**

| අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරී වසම | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පුත්තලම | ආණමඩුව<br>ආණමඩුව | ආලංකුලම<br>7 ගම්මානය | 150<br>157 |
| 02 | අම්පාර | ලාහුගල | පානම | 143 |
| 03 | පොළොන්නරුව | දිඹුලාගල | පහළ ඇල්ලේවැව | 118 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | කළුතර | මතුගම | ඕවිටිගල | 202 |
| 05 | කුරුණෑගල | රිදීගම | රත්විට | 183 |
| 06 | ගම්පහ | මීරිගම | කීණදෙනිය | 181 |
| 07 | මොනරාගල | බඩල්කුඹුර<br>බඩල්කුඹුර | නක්කල<br>වෙහෙරගොඩ | 206<br>194 |
| 08 | රත්නපුරය | කුරුවිට | බටතොට | 178 |
| 09 | මොනරාගල | මොනරාගල | මදුරුකැටිය | 85 |
| 10 | රත්නපුරය | කොලොන්න<br>ඇලපාත | මඩුවන්වල<br>දම්බුළුවන | 350<br>185 |
| 11 | බදුල්ල | වැලිමඩ | දිවිතොටවෙල | 158 |
| 12 | අම්පාර | දමන | මොරගහපල්ලම | 161 |
| 13 | රත්නපුරය | බලංගොඩ | වැලිපතයාය | 173 |
| 14 | ගම්පහ | ගම්පහ | කෙසෙල්වතුගොඩ | 186 |
| 15 | මහනුවර | පාතදුම්බර | මහකුඹුර | 166 |
| 16 | පුත්තලම | දංකොටුව | කුඩවිල | 118 |
| 17 | මහනුවර | පන්විල | මහපතන | 151 |
| 18 | ගම්පහ | ජාඇල<br>ජාඇල<br>දොම්පෙ | තුඩැල්ල<br>රාගම<br>උඩවෙල | 210<br>198<br>164 |
| 19 | කෑගල්ල | කෑගල්ල | උඩුගොඩ | 201 |
| 20 | ගම්පහ | ගම්පහ | පහලගොඩයාය | 207 |
| 21 | පුත්තලම | හලාවත | තිඹිල්ල | 84 |

# 07. සමාජ සත්කාරක ව්‍යාපෘතිය

**මෙහෙවර**

සත්කාරක සමාජයක් බිහි කිරීම.

**අරමුණ**

සමාජ සත්කාරක මධ්‍යස්ථානය /ඒකකය වෙත සේවාලබාගැනීම සඳහා පැමිණෙන සේවා ලාභීන් වෙත පුළුල් වූත් , ඒකාබද්ධ වූත් සමාජ සුභසාධන සේවාවක් සැපයීම.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 05/1972/023/001 වූ , ශ්‍රී ලංකාවේ සුනාමි ව්‍යසනයට හසුවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සමාජ සත්කාරක මධ්‍යස්ථාන පිහිටුවීම යන මැයෙන් සමාජ සේවා හා සමාජ සුභසාධන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2005.12.07 දිනැති සංදේශයට ලද අනුමැතිය මත සමාජ සත්කාරක මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

සමාජ සත්කාරක මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ පොදු අරමුණ වන්නේ සේවා ලබන්නන් සඳහා හිතකර පරිසරයක් ගොඩනැංවීම තුළින් ඒකාබද්ධ හා සමස්ත සේවා සැපයුමක් සම්පාදනය කිරීමයි. එහෙයින් මෙම මධ්‍යස්ථානය සියලුම සුභසාධන අවශ්‍යතා එක් තැනකින් ලබා ගත හැකි මධ්‍යස්ථානකි.ජනතාවගේ,විශේෂයෙන් ම අවධානම් තත්ත්වයට ලක් වූවන් ගේ අවශ්‍යතා සපුරාලීම මගින් ඔවුන් ප්‍රධාන සංවර්ධන ප්‍රවාහයට එක් කර ගැනීමට උපකාර කිරීමට හැකියාව ලැබේ.එසේම සමාජ සත්කාරක මධ්‍යස්ථාන ආන්තික ජනතාව සඳහා ආරක්ෂක දැලක් වශයෙන් ද ක්‍රියාත්මක වේ.ඒකාබද්ධ හා පවත්නා සේවා සැපයුමක් සඳහා ක්ෂේත්‍ර නිලධාරින්ට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීම සමාජ සත්කාරක ව්‍යාපෘතිය මගින් සිදුකෙරේ.

මෙම වැඩසටහන සමාජ සේවා අමාත්‍යාංශය,ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා පළාත් සමාජ සේවා අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අතර එම ආයතන වල පහත නිලධාරීන් ඒකාබද්ධව සේවා සපයනු ලබයි.

01. සමාජ සේවා නිලධාරි (මධ්‍යම / පළාත්)
02. උපදේශන නිලධාරි
03. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
04. සමාජ සංවර්ධන සහකාර
05. වනිතා සංවර්ධන නිලධාරි
06. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
07. මුල් ළමාවිය සංවර්ධන සහකාර
08. සහන සොයුරිය

එමෙන්ම පරිවාස නිලධාරින් හා රාජ්‍ය නොවන නිලධාරීන් ගේ සේවය ද ලබා ගන්නා අතර මේ වන විට ආරම්භ කර ඇති බොහෝ මධ්‍යස්ථානවල හා සමාජ සත්කාරක මධ්‍යස්ථාන /ඒකක වල අනෙකුත් බොහෝ ක්ෂේත්‍ර නිලධාරීන් ද ඒ ඒ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් අනුයුක්ත කර ඇත.

ව්‍යාපෘතියේ ආරම්භයේ සිට 2008 වසර අවසානය වන විට යුනිසෙෆ් හා ශ්‍රී ලංකාවේ ළමා රැකවරණය ආයතනයේ අනුග්‍රහය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 27 හි සමාජ සත්කාරක මධ්‍යස්ථාන පිහිටුවා සේවා සැපයීම ආරම්භ කරන ලදී. ඒ උක්ත සමාජ සත්කාරක මධ්‍යස්ථාන සාර්ථක ප්‍රගතියක් දක්වන ලද බැවින් වෙන් වූ ගොඩනැගිලි ඉදි නොකර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සමාජ සත්කාරක සංකල්පය ක්‍රියාත්මක කිරීම 2009 වසරේ දී ආරම්භ කරන ලදී.2012වසර වන විට සමාජ සත්කාරක මධ්‍යස්ථාන /ඒකක 96 ක් පිහිටුවා ඇති අතර 2012 වසරේ දී මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ද බදුල්ල දිස්ත්‍රික්කයේ ඉතිරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලද ව්‍යාපෘති දියත් කර ඇත.2009 වසරේ සිට මේ දක්වා ව්‍යාපෘතිය ආරම්භය දක්වා සේවාලාභියා පදනම් කරගත් පුද්ගලාන්තර සේවා සැපයීම සිදුකල අදාල ක්ෂේත්‍ර නිලධාරින් මෙම සංකල්පය භාවිතා කරමින් පවුල පදනම් කරගත් ඒකාබද්ධ සේවා සැපයීමක් සිදුකරනු ලබයි.ඒ සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම හා කුසලතා වර්ධනය අමාත්‍යාංශය විසින් තවදුරටත් සිදුකරනු ඇත.

**2013 වසරේ ප්‍රගතිය**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන-රු.මි.5**

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

මේ යටතේ 2013 වසරේ ගාල්ල දිස්ත්‍රික්කයේ සමාජ සත්කාරක මධ්‍යස්ථාන අතර අත්දැකීම් හුවමාරුවක් සහ ප්‍රගති සමාලෝචන වැඩසටහනක් ගාල්ල දිස්ත්‍රික් ලේකම් ගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇති අතර මේ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් 50දෙනෙකු සංඛ්‍යාවක් සහභාගී විය.මේ සඳහා වැය වූ මුදල රු.49,750/-කි.මෙයට අමතරව පුහුණු මොඩියුලයක් සකස් කිරීමේ වැඩමුළුවක් ද පවත්වන ලදී.

**සමාජ සත්කාරක ඒකක ඉදිකිරීම**

පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමාජ සත්කාරක ඒකක පිහිටුවීම සඳහා මෙම වසරේ ඒකාබද්ධඅරමුදලෙහි ප්‍රතිපාදන වලින් 1,949,104/-ක් වැය කර ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | ලබාදුන් ප්‍රතිපාදන(රු) |
|---|---|---|
| 01 | පන්විල | 52,415/- |
| 02 | තණමල්විල | 604,960/- |
| 03 | වැල්ලවාය | 300,000/- |
| 04 | බිබිල | 167,294/39 |
| 05 | පස්සර | 177,543/94 |
| 06 | ඇළහැර | 300,000/- |
| 07 | දිඹුලාගල | 346,890/- |
| 08 | හබරාදූව (වැඩි දියුණු කිරීම) | 320,000/- |
| 09 | අකුරණ (වැඩි දියුණු කිරීම) | 65,000/- |

දකුණු හා බස්නාහිර පළාත් වල සමාජ සත්කාරක මධ්‍යස්ථාන 13 හි පරිපාලන හා නඩත්තු වියදම් සඳහා 2013 වසරේ දෙසැම්බර් මස වන විට රු.මිලියන 2.486ක මුදලක් මුදා හැර ඇත.

**මූල්‍ය ආයතනය**

**යුනිසෙෆ් අරමුදල්- රු.7,449,300.84/-**

2013 දෙසැම්බර් මස වන විට රු.5,068,798.17/-ක මුදලක් සමාජ සත්කාරක වැඩසටහන සඳහා වෙන් කර ඇත.

### ප්‍රගති සමාලෝචන රැස්වීම

නුවර එළිය දිස්ත්‍රික්කයේ පෙබරවාරි 02 දින අතිරේක දිස්ත්‍රික් ලේකම් හා පරිවාස කොමසාරිස්(මධ්‍යම) ,සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් හා ක්ෂේත්‍ර නිලධාරීන් ගේ සහභාගීත්වයෙන් පැවැත්විනි.මේ සඳහා සහභාගී වූ මුලු සංඛ්‍යාව 27කි.මුලු වියදම රු.34,965 කි.

### මනෝ සමාජීය නිලධාරීන් සඳහා ප්‍රගති පාලන රැස්වීම

වවුනියා,මන්නාරම,කිලිනොච්චිය හා මුලතිවු දිස්ත්‍රික්කයන්හි සේවය සඳහා මනෝ සමාජීය නිලධාරින් 20 දෙනෙකු බඳවා ගත් අතර ඔවුන් සඳහා පුහුණු වැඩමුලු 02 ක් පවත්වන ලදි.මේ සඳහා වැය වු මුදල රු.44,900/- කි.මීට අමතරව පලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලු නිලධාරින් සඳහා උපදේශනය සඳහා එක් දින වැඩසටහන් 02ක් පවත්වා ඇත.මේ සඳහා වැය වූ මුදල රු.73,447/-කි.

### උපකරණ සැපයීම

සමාජ සත්කාරක ඒකක වල භාවිතය සඳහා  බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා පරිගණක,පරිගණක මේස හා පුටු ලබා දෙන ලදී.ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයට පරිගණක යන්ත්‍ර 05ක් සහ මුද්‍රණ යන්ත්‍ර 10ක් ද මොණරාගල දිස්ත්‍රික්කය සඳ පරිගණක යන්ත්‍ර 02,පරිගණක මේස පුටු 10 ක් සහ මුද්‍රණ යන්ත්‍ර 11ක් ලබා දී ඇත.

### ධාරිතා සංවර්ධන වැඩසටහන

සමාජ සත්කාරක ව්‍යාපෘතියට සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සමාජ සත්කාරක සංකල්පය හා භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් 03 ක් ,මහනුවර,පොල්ගොල්ල සමූපකාර සංවර්ධන ආයතනයේදී පවත්වන ලදි.මෙම වැඩසටහනට මහනුවර,මාතලේ සහ නුවර එළිය දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුලත්ය.වැය වූ මුලු මුදල රු 451,267/- කි.සහභාගී වූ නිලධාරින් සංඛ්‍යාව 231කි.මීට අමතරව පොළොන්නරුව,ගිරිතලේ වන ජීවී පුහුණු ආයතනයේදී පවත්වන ලද වැඩසටහන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07හි ක්ෂේත්‍ර නිලධාරින් 27 ක ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.ඒ සඳහා වියදම රු.131,345/-කි.තවද අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක ක්ෂේත්‍ර නිලධාරින් සඳහා (සිංහල මාධ්‍ය) තවත් පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර ඒ  සඳහා සහභාගී වූ සංඛ්‍යාව 29 කි.වැය වූ මුදල

රු.80,390/-කි.මෙම වැඩසටහන් වලදී කණ්ඩායම් ගොඩනැගීම,සමාජ වැඩ හැදින්වීම,විෂය කළමණාකරණය,උපදේශනයේ මූලික කුසලතා,විෂය සම්මන්ත්‍රණය,පවුල් කණ්ඩායම් සම්මන්ත්‍රණය හා වාර්තාකරණය යන මාතෘකා යටතේ නිලධාරීන් දැනුවත් කරන ලදී.

**පුහුණුකරවන්නන්ගේ මොඩියුලය**

පුහුණු කරවන්නන්ගේ මොඩියුලය (ඉංග්‍රිසි බසින්) සංස්කරණය කිරීමසිදුවිය.

ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා වන පුහුණු මොඩියුලය(කෙටුම් පත) සැකසීම ද මෙම වසරේ දී සිදුවිය.

**අවදානමට ලක් වූ දරුවන් සහිත පවුල් සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

2013 වර්ෂය අවසාන වන විට තනි මාපිය පවුල් වල සුභසාධනය හා ඔවුන් ගේ ජීවන මට්ටම නඟා සිටුවීම සඳහා මුලතිව්,ත්‍රිකුණාමලය හා අම්පාර දිස්ත්‍රික්ක තුනෙහි පවුල් 44ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දෙන ලදී.ඒ සඳහා රු.1,174,505/-ක් වැය කෙරිනි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පවුල් සංඛ්‍යාව | ආධාර මුදල |
|---|---|---|---|
| මුලතිව් | මැරටයිම් පත්තු | 08 | 320,000/- |
| ත්‍රිකුණාමලය | පදවි ශ්‍රී පුර | 02 | 50,000/- |
| | කන්තලේ | 02 | 50,000/- |
| | කින්නියා | 02 | 50,000/- |
| අම්පාර | කල්මුණේ | 05 | 125,000/- |
| | දමන | 08 | 159,000/- |
| | කරයිතිවු | 17 | 420,000/- |

**වින්ධිත උපකාරක වැඩසටහන**

වින්ධිත උපකාරක වැඩසටහන යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කන්ද කැටිය,මීගහකිවුල,හල්දුම්මුල්ලසොරණාතොට,රිදීමාලියැද්ද,හාලිඇල,හපුතලේ,මහියංගනය,පස් සර හා ඌවපරණගම යනප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 කට සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල, බඩල්කුඹුර, මැදගම, තණමල්විල, බිබිල, මඩුල්ල, මොණරාගල, වැල්ලවාය, බුත්තල හා කතරගම යනප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 කට අවධානමට ලක් වූවන් සඳහා එක් කොට්ඨාශයකට රු 5000/- බැගින් රු 100,000/-ක මුදලක් ලබා දී ඇත.

**ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන**

මේ යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල, ඌව පරණගම, පස්සර, හපුතලේ, වැලිමඩ,හාලි ඇළ, ලුණුගල, බදුල්ල, ඇල්ල හා මහියංගනය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට ප්‍රජා නායකයන් සමාජ සත්කාරක මධ්‍යස්ථානවලින් ඉටුකෙරෙන සේවාවන් පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් සඳහා රු.10,000/-බැගින් මුදල් ලබා දී ඇති අතර මේ සඳහා රු.100,000/-ක මුදලක් වැය කෙරිනි.එමෙන්ම මොණරාගල දිස්ත්‍රික්කයේ මහියංගණය,මඩුල්ල,තණමල්විල, වැල්ලවාය,බඩල්කුඹුර,සෙවනගල,මැදගම, බිබිල, බුත්තල හා කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්රජා නායකයන් සමාජ සත්කාරක මධ්‍යස්ථානවලින් ඉටුකෙරෙන සේවාවන් පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් සඳහා රු.10,000/-බැගින් මුදල් ලබා දී ඇති අතර මේ සඳහා ද රු.100,000/-ක මුදලක් වැය කෙරිනි.

**සමාජ සත්කාරක ඒකක පිහිටුවීම**

2013 වර්ෂය තුල වැල්ලවාය,බුත්තල,තණමල්විල,මඩුල්ල,මැදගම,උඩුනුවර,බදුල්ල,පාතදුම්බර හා රිදීමාලියැද්ද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල නාම පුවරු සවි කිරීම සඳහා රු.54,483/-ක මුදලක් සහ අලුත් වැඩියා සඳහා රු.201,819/-ක මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.තවද සමාජ සත්කාරක ඒකක ඉදිකිරීම සඳහා පහත සඳහන් ආකාරයට මුදල් යවා ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | ලබාදුන් ප්‍රතිපාදන(රු) |
|---|---|---|
| 01 | ඇල්ල | 448,853/43 |
| 02 | බදුල්ල | 206,608/- |

| | | |
|---|---|---|
| 03 | පාතදුම්බර | 65,000/- |
| 04 | උඩපලාත | 65,000/- |

මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලැබූ සියලු පුහුණු කිරීම් වල අවසාන අරමුණ ග්‍රාමීය මට්ටමේ සේවා ලාභීන්ට ගුණාත්මක සේවාවන් ලබා දීමයි.රජයේ විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු මගින් පත් කර ඇති නිලධාරීන් වෙන් වෙන් ව රට පුරා විසිරී ඇති අවධානම් සහගත සේවා ලාභීන් පිරිසකට සේවා සැපයීමේ දී ඇතිවන ගැටළු, දුර්වලතා සහ සම්පත් අපතේයාම සමාජ සත්කාරක ඒකක මගින් ඒකාබද්ධ සේවාවක් සැපයීම තුලින් මග හරවා ගත හැකි අතර වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබා දිය හැකි බැව් පසු විපරම් වලදී හඳුනාගෙන ඇත.

# 08. ගිණුම් අංශය

## මෙහෙවර

"රාජ්‍ය ප්‍රතිපත්ති අනුව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම මගින් ලබාගන්නා මුදල් නිවැරදිව දිශානුගත කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හසුරවමින් මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ශක්තිමත්, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා දායකත්වය ලබාදීම."

**ප්‍රධාන අරමුණු -:**

**2013 වර්ෂය තුලදී සමාජ සේවා අමාත්‍යාංශයේ සමාජ සංවර්ධන දැක්ම සහ මෙහෙයුම් සඳහා මුදල් රෙගුලාසි 135 යටතේ ලබාදී ඇති බලතල අනුව,**

- **සියලුම ගණුදෙනු නිවැරදි හා යාවත්කාලීනව ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.**
- **මුල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගැනීම සහ මුල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම.**
- **සියලුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.**
- **වියදම් සමාලෝචනය සහ යෝජනා ඉදිරිපත් කිරීම.**
- **මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධිකරණ කටයුතු කිරීම.**

**ප්‍රධාන ක්‍රියාකාරකම් -:**

1. වාර්ෂිකව පිළියෙල කරනු ලබන කෙටුම්පත් ඇස්තමේන්තුව ජාතික අයවැය දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, ඒට අදාල සම්බන්ධිකරණ කටයුතු ඉටුකිරීම.

   2014 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ සාකච්ඡාව සමාජ සේවා ගරු අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් 2013/08/21 වන දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේ පවත්වන ලදී.

2. ජාතික අයවැය දෙපාර්තුමේන්තුව මගින් අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කිරීම. මේ අනුව 2013 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශයේ ශිර්ෂ අංක 124 යටතේ ලබාගෙන ඇති ප්‍රතිපාදන විස්තර පහත සඳහන් වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ප්‍රතිපාදන රු. | අතිරේක ප්‍රතිපාදන රු. | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. | 2013 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 3,144,903,800/- | 18,671,000/- | 3,163,574,800/- | 2,864,614,232/- |
| ප්‍රාග්ධන වියදම | 343,356,200/- | 27,300,000/- | 370,656,200/- | 263,163,620/- |
| සමස්ත වියදම | 3,488,260,000/- | 45,971,000/- | 3,534,231,000/- | 3,127,777,852/- |

මෙම මුළු ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රු.මි. 2,898 ක් පමණ පුනරාවර්තන වියදම් සඳහාත් රු.මි.10ක් පමණ ප්‍රාග්ධන වියදම් සඳහාත් ප්‍රතිපාදන නිදහස් කර ඇත.

2013 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ නව ව්‍යාපෘතියක් ලෙස "දිරිසවිය" ව්‍යාපෘතිය සඳහා රු.මි.123 ක් සහ දැනට මහජන ආධාර සහ සමෘද්ධි ආධාර ලබන වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන් 230,000 ක් සඳහා රු.1000/- දීමනාව මාසිකව ලබාදීමේ වැඩසටහන සඳහා රු.මි.1,300 ක් දක්වා වැඩි කිරීම තුළින් මෙම වර්ෂයේ සුභසාධන වැඩසටහන් සඳහා රු.මි. 2,847 ක් වෙන් වීම නිසා 2012 වර්ෂයට වඩා ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.මි.2,159.37 ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

3. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුව මගින් අනුමත අක්මුදල් නිසිපරිදි ලබාගැනීම සහ කළමනාකරණය කිරීම.

2013 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට ලබාගත් අක්මුදල් ප්‍රමාණය පහත පරිදිය.

| පුනරාවර්තන රු. | ප්‍රාග්ධන රු. | අත්තිකාරම් " බී" ගිණුම රු. | විදේශ අරමුදල් (යුනිසෙෆ්) රු. | මුලු අක්මුදල් ප්‍රමාණය රු. |
|---|---|---|---|---|
| 907,472,999/- | 46,400,000/- | 3,000,000/- | 10,880,520/- | 967,753,519/- |

4. අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය සඳහා මාසික වැටුප් හා දීමනා පිළයෙල කිරීම සහ ගෙවීම් කටයුතු සිදුකිරීම.

   2013 වර්ෂයේ සේවක වැටුප් හා දීමනා වෙනුවෙන් රු.මි.100.05 ක ප්‍රතිපාදන වෙන්වී ඇති අතර වැටුප් හා දීමනා සඳහා දෙසැම්බර් මස අවසන් වන විට දරා ඇති මුළු වියදම රු.මි. 97.12 වේ.

5. අනිකුත් සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන ගෙවීම් වව්චර්පත් පරික්ෂා කිරීම හා අදාල වැය විෂයන් යටතේ සහතික කිරීම, ගෙවීම් කිරීම හා ගිණුම්ගත කිරීම.

6. මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම, වාර්තා පවත්වාගෙනයාම සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව සහ විගණකාධිපති වෙත මාසික වාර්තා ඉදිරිපත් කිරීම.

7. අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය සඳහා ආපදා ණය මුදල්, උත්සව අත්තිකාරම් ලබාදීම සහ ඊට අදාල වාරික හා පොළිය අයකර ගැනිමත් එහි පාලන ගිණුම හා ලේඛන පවත්වා ගෙන යාම.

   2013 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වනවිට රාජ්‍ය නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ රුපියල් මිලියන 4.11 ක් ගෙවා ඇත. අත්තිකාරම් ගිණුමෙහි අයකර ගැනීම රුපියල් මිලියන 4.37 ක් පමණ වි ඇත.

8. අමාත්‍යාංශය මගින් අයකර ගතයුතු සියළුම ලැබීම් එකතු කිරීම, බැංකු වෙත තැන්පතු කිරීම සහ අදාල අදායම් ශිර්ෂයන් යටතේ ගිණුම් ගත කිරිම.

9. වාර්ෂික විසර්ජන ගිණුම් පිළියෙල කිරිම සහ සෑම වර්ෂයකදීම මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම.

   විසර්ජන ගිණුම් තුළින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන ලැබීම සහ සමස්ත වියදම් දැරීම පිළිබඳව ගිණුම් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන අදාල වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීම,

   බැරකම් විස්තර මෙන්ම අපහරණ වත්කම් පිළිබඳ වාර්තා ඊට අන්තර්ගත කිරිම.

10. 2013 වර්ෂය තුළ භාණ්ඩ හා සේවා සැපයීම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීම හා ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීම.

11. සියලුම වියදම් පිළබඳව පවතින විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු සැපයීම සහ ඊට අදාල සම්බන්ධිකරණ කටයුතු ඉටුකිරීම.

12. වාර්ෂිකව භාණ්ඩ සමික්ෂණ සිදුකිරීම, ලේඛන යාවත්කාලින කිරීම සහ අපහරණය කළයුතු භාණ්ඩ හඳුනා ගැනීම සහ අපහරණ ක්‍රියාවලිය සිදුකිරීම. මේ වන විට 2013

වර්ෂයේ අපහරණය කළයුතු භාණ්ඩ හඳුනාගෙන අපහරණය ක්‍රියාවලියට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

13. අමාත්‍යාංශයේ පාරිභෝජන හා ප්‍රාග්ධන භාණ්ඩ තොග සහ ගබඩා පවත්වා ගෙන යාම සහ භාණ්ඩ නිකුත්කිරීම සහ කළමණාකරණය කිරීම.

14. අමාත්‍යාංශයේ වියදම් මාසිකවත් ප්‍රගතිය කාර්තුමය ලෙසත් ප්‍රගතිවාර්තා පිළියෙල කර සැලසුම් අංශයට ලබාදීම සිදුකරනු ලබන අතර ආබාධිත පුද්ගල දීමනා ගෙවීම සහ ප්‍රාදේශීය ලේබම් කාර්යාල වල සේවය කරන නිළධාරින්ගේ වැටුප් ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකරයි.

15. ජාතික සමාජ සංවර්ධන ආයතනය, ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික මණ්ඩලය හා ලේකම් කාර්යාලය, ආබාධිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්තාපන වැඩසටහන, සමාජ සංවර්ධන කළමණාකරණ තොරතුරු පද්ධතිය, සමාජ සංවර්ධනය, තනිමාපිය පවුල් සඳහා ස්වයං රැකියා අවස්ථා ලබාදීම, ජාතික උපදේශන වැඩසටහන, සමාජ සත්කාරක මධ්‍යස්ථාන සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හා ශ්‍රී ලංකා රජය අතර ඇති ආධාර වැඩසටහන යන ආයතන වෙනුවෙන් මූල්‍ය කළමණාකරණයට අදාල මාර්ගෝපදේශ සහ ගිණුම් පවත්වාගෙන යාමට සහය වීමද 2013 වර්ෂයේ දී සිදුකර ඇත

මෙලෙස 2013 වර්ෂයේ සමාජ සේවා අමාත්‍යාංශය වෙත පැවරි ඇති සමාජ සංවර්ධන වැඩසටහන් තුළ මූල්‍ය කළමණාකරණය ශක්තිමත් ලෙසින් පවත්වා ගනිමින් ගිණුම් යාවත්කාලීන කිරිමටත් කටයුතු කිරීම තුළින් රටේ සමාජ සංවර්ධනය ක්‍රියාවලිය සඳහා උපරිම දායකත්වයක් ගිණුම් අංශය විසින් ලබාදීම සිදුකර ඇත.

# 09. සැලසුම් හා මෙහෙයුම් අංශය

## හැඳින්වීම

රාජ්‍ය ප්‍රතිපත්ති වලට සහ ප්‍රමුඛතාවයන්ට අනුව රජයේ දෙපාර්තමේන්තු, ආයතන, මූල්‍ය ප්‍රදාන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන වැනි අදාල පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් සකස් කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශයේ පරමාර්ථයයි.සමාජයීය අංශය ආශ්‍රිත දත්ත සහ තොරතුරු රැස්කිරීමද මෙම අංශයේ වගකීමකි.

## කාර්යයන්

අමාත්‍යාංශයේ සැලසුම් හා මෙහෙයුම් අංශයෙන් පහත විශේෂ කර්තව්‍යයන් සිදුකරනු ලැබේ.

- අදාල පාර්ශවකරුවන් සමග අමාත්‍යාංශයේ විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්ති සකස් කිරීම.
    - ශ්‍රී ලංකාව සඳහා වන පවුල් ප්‍රතිපත්තිය 2012 වර්ෂයේ සිට සකස්කරමින් පවතින අතර මේ වනවිට එය කෙටුම්පතක් ලෙස සකස් කොට ප්‍රජාවගේ අදහස් සඳහා යොමු කොට ඇත.මෙය 2014 වර්ෂයේ අවසන් කිරීමට නියමිතය.

- රජයේ ප්‍රමුඛතා සහ අර්ධ වාර්ෂික අය වැය ප්‍රතිපාදන අනුව අමාත්‍යාංශය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම.
    - 2013 වර්ෂය සඳහා අදාල අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සලැස්ම 2012 වර්ෂයේදී සකස් කරන ලදී.

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තු සඳහා ප්‍රගති වාර්තා සකස් කිරීම
    - 2013 වර්ෂයේ දී ත්‍රෛමාසික වාර්තා සකස්කරන ලදී.

- අයවැය විවාදය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තා සකස් කිරීම.
    - 2013 තෙවන කාර්තුව දක්වා ප්‍රගතිය ඇතුළත් ප්‍රගති වාර්තාව සකස් කර ඇත.
- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
    - 2012 වසරේ කාර්ය සාධන වාර්තාව 2013 වසරේදී සකස්කරන ලදී.
- සාර්ක් සමාජ ප්‍රඥප්තියට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- උගත් පාඩම් කොමිසමේ නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ක්‍රියාකරකම්වල ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත වාර්තා කිරීම
- සමාජීය ක්ෂේත්‍රයට අදාලව විවිධ අංශ වෙත සැපයිය යුතු වාර්තා සකස් කිරීම
- සමාජයේ අවාසි සහගත තත්ත්වයන්හි වෙසෙන ජන කොටස්වල සුභසාධනය වෙනුවෙන් රජයේ ප්‍රමුඛතාවයන්ට අනුව නව ව්‍යාපෘති යෝජනා සකස් කිරීම
- ලෝක බැංකුව, යුනිසෙෆ්, UNPFA, WFA, WHO, UNV සහ UNDP සමඟ පවත්වනු ලබන සාකච්ඡා සහ සම්මන්ත්‍රණයන්හිදී ගනු ලබන තීරණ පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

ඉහත කර්තව්‍යයන්ට අමතරව 2013 වර්ෂයේදී සැලසුම් අංශය මඟින් ඉටුකරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැකිය.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

### ***<u>"සමාජ සේවා පුවත් " ත්‍රෛමාසික පුවත් සඟරාව</u>***

"සමාජ සේවා පුවත් " තෛමාසික පුවත් සඟරාවද මෙම අංශය මඟින් ප්‍රකාශයට පත්කරනු ලැබේ. අමාත්‍යාංශයේ විවිධ අංශ මඟින් සිදුකරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් හා සේවාවන් පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත වේ. එසේම කාර්ය සැලැස්මට අනුව ක්‍රියාකාරකම්හි ප්‍රගතියද විශේෂ අවස්ථාද සමාජ සේවාවන්ට අදාල ලිපිද ඉන් ඉදිරිපත් කරයි. එය රේඛීය අමාත්‍යාංශ, ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර බෙදාහරිනු ලබයි. මෙම වර්ෂයේ පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනට සමගාමීව ***"සමාජ සේවා පුවත් - දැයට කිරුළ විශේෂ කලාපය"*** 2013 මාර්තු මස නිකුත් කරන ලදී.

### ***<u>ශ්‍රී ලංකාව පිළිබඳ පවුල් ප්‍රතිපත්තිය නැවත සකස් කිරීම</u>***

රටෙහි අවාසි සහගත කණ්ඩායම්හි ජීවන තත්වය නැංවීම උදෙසා මගපෙන්වීමක් ලබාදෙනු වස් පවුල් ප්‍රතිපත්තිය නම් ප්‍රතිපත්ති ප්‍රකාශයක් 2012 වසරේදී සකස් කරන ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණයන්ට අනුව මහාචාර්ය කේ.කරුණාතිලකයන්ගේ ප්‍රධානත්වයෙන් සැදුම්ලත් කණ්ඩායමක් මෙම ලේඛනය වඩාත් පුළුල් දැක්මකින් යුතුව සකස් කිරීම සඳහා සංශෝධන කටයුතු සිදුකරනු ලබන අතර එහි සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

## ***"දිරි සවිය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම***

ලෝක බැංකු ආධාර යටතේ 2013 වසරේ සිට ක්‍රියාත්මක වන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන මූල්‍ය ප්‍රදානය හා වෘත්තීය පුහුණුව ලබාදීමේ "දිරිසවිය" ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් සිදුකෙරේ.

## ***ස්වේච්ඡා සේවක ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම***

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, UNDP හා UNV යන ආයතන සමග එක්ව සමාජ සේවා අමාත්‍යාංශය තුළ ස්වේච්ඡා සේවක ලේකම් කාර්යාලය 2013 වසරේදී ස්ථාපිත කරන ලදී. මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු සැලසුම් හා මෙහෙයුම් අංශය විසින් සිදුකරන ලදී.

# 10. අභ්‍යන්තර විගණන අංශය

**<u>හැඳින්වීම</u>**

**සමාජ සේවා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණක යටතේ ක්‍රියාත්මක වන අතර මු.රෙ 134 (1) ප්‍රධාන අභ්‍යන්තර විගණක සෘජුවම අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුව වග කියනු ලැබේ. මෙම අංශය අභ්‍යන්තර විගණන නිළධාරින් (සංවර්ධන නිලධාරීන්) දෙදෙනකුගෙන් සමන්විත වේ.**

**<u>අරමුණු</u>**

**2013 වර්ෂය තුළදී සමාජ සේවා අමාත්‍යාංශයේ සමාජ සංවර්ධන දැක්ම සහ මෙහෙයුම් සඳහා මුදල් රෙගුලාසි 133 යටතේ ලබා දී ඇති බලතල අනුව කටයුතු කිරීම.**

**<u>විෂය පථය</u>**

1. සමාජ සේවා අමාත්‍යාංශය
2. සමාජ සේවා දෙපාර්තමේන්තුව.
3. ජාතික සමාජ සංවර්ධන ආයතනය.
4. ආබාධිතයන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය.
5. ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය.
6. දෘශ්‍යාබාධිතයන් පුනුරුත්තාපන භාර අරමුදල.

**<u>ක්‍රියාකාරකම්</u>**

01. 2013 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම සාර්ථකව නිමකිරීම.

02. කළමණාකරණ හා විගණන කමිටු රැස්වීම් වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම.

කළමණාකරණ හා විගණන කමිටු රැස්වීම්හිදී අභ්‍යන්තර විගණන වාර්තා පිළිබඳව මාසිකව හා කාර්තු වශයෙන් සාකච්ඡා කිරිම.

රැස්වීම් පැවැත්වූ දින පහත පරිදි වේ.

| **මාසික රැස්වීම්** | **කාර්තු රැස්වීම්** |
|---|---|
| 2013/3/25 | 2013/3/27 |
| 2013/6/12 | 2013/6/14 |
| 2013/08/22 | 2013/08/23 |
| 2013/11/12 | 2013/11/14 |

**<u>විශේෂ ක්‍රියාකාරකම්</u>**

01. සමීක්ෂණ

- ආබාධිත මහ ලේකම් කාර්යාලය විසින් ලබා දෙනු ලබන නිවාස හා ස්වයං රැකියා පිළිබඳ සමීක්ෂණය
- වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් අවු.70 ට වැඩි පුද්ගලයන්ට ලබාදුන් රු.1000/- දීමනාව.
- දිරිසවිය ව්‍යාපෘතිය යටතේ ආබාධිත පුද්ගලයින් සඳහා මුදල් මාරු කිරීම හා වෘත්තීය පුහුණු ව්‍යාපෘතිය

  (රු.3000/- දීමනාව, දිස්ත්‍රික් 9 කට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 90කි)

02. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නිරීක්ෂණය.

(තෙලඹුයාය, කැටවල, වත්තේගම, සීදුව, ජයවිරුසෙවණ හා ජයවිරු සමාධි නිවහන- පුවක්පිටිය )

03. විශේෂ විමර්ෂණ

අමාත්‍යාංශයේ ලේකම් වෙත පැමිණිලි කරන විශේෂ කරුණු පිළිබඳව විශේෂ විමර්ෂණ පවත්වා වාර්තා කිරීම.

*සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

# Pictorial Review



ආබාධිත දින සැමරුම් උත්සවයේ ආබාධිත දරුවන්ගේ නර්තන අවස්ථාවක්

அங்கவீனமுற்ற நபர்களுக்குகான சர்வதேச தினத்தில் இடம்பெற்ற நடன நிகழ்வொன்று - 2013

Dancing event of disabled children in the commemoration ceremony of the international disable day – 2013



ආබාධිත පුද්ගලයන් සඳහා දකුණු ආසියාවේ වඩාත් හිතකාමී නගරය ලෙස වැල්ලවාය නගරය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නම් කොට එයට අදාල සහතික පත්‍රය ගරු කථානායක චමල් රාජපක්ෂ මහතා වෙත පිලිගැන්වූ අවස්ථාව

அங்கவீனமுற்ற நபர்களுக்கான மிகவும் சிநேகபூர்வமான நகரமாக வெல்லவாய நகரம் உலக சுகாதார அமைப்பினால் பெயரிடப்பட்டு அதற்கான சான்றிதழ், சபாநாயகரான கௌரவ சமல் ராஜபக்ச அவர்களுக்கு வழங்கிய வேளையில்

Hon. Chamal Rajapaksa, the speaker being presented with the certificate with regard to designating wellawaya the most disabled – friendly town in the Asia by the world health organization



ගරු අමාත්‍යතුමා විසින් කණ්නාඩි යුවලක් ලබාදීම - දැයට කිරුළ 2013

கௌரவ அமைச்சர் அவர்களினால் மூக்குக்கண்ணாடிகள் வழங்குதல் - தேசத்திற்கு மகுடம் 2013

Donating a pair of spectacles by Hon. Minister – Deyata Kirula 2013



සිසුණැන පුබුදුව වැඩසටහන මගින් කියවීමේ මධ්‍යස්ථානයක් විවෘත කිරීම

சிசுநன புபுதுவ நிகழ்ச்சித் திட்டத்தினூடாக வாசிகசாலையொன்றினைத் திறந்து வைத்தல்.

Opening ceremony of a reading center under the

“Sisunena Pubuduwa” programme





ආබාධිත දින සැමරුම් පෙළපාලිය 2013

அங்கவீனமுற்ற நபர்களுக்கான சர்வதேச தினக் கொண்டாட்ட நடை பவனி 2013.

The array to mark international disabled day – 2013

ආබාධිත දරුවෙකු සඳහා ගරු අමාත්‍යතුමා විසින් රෝද පුටුවක් පරිත්‍යාග කිරීම

அங்கவீனமுற்ற சிறார் ஒருவருக்கு கௌரவ அமைச்சர் அவர்களினால் சக்கர நாற்காலி வழங்கியபோது

Donating a wheel chair to a disabled child by Hon. Minister





ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් රෝද පුටුවක් ලබාදීම

கௌரவ பிரதி அமைச்சர் அவர்களினால் சக்கர நாற்காலி வழங்குதல்

Donating a wheel chair by Hon. Deputy Minister

සී.බී.ආර්. ව්‍යාපෘතිය මගින් නිවෙස් මට්ටමේ පුනරුත්ථාපනය සිදු කිරීම.

சீ.பீ.ஆர் கருத்திட்டத்தினூடாக வீட்டு மட்டத்தில் புனர்வாழ்வு இடம்பெறுதல்.

Home based rehabilitation implemented by CBR




සී.බී.ආර්. වැඩසටහන මගින් ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා පුහුණුව ලබා දෙමින්

சீ.பீ.ஆர். நிகழ்ச்சித் திட்டத்தினூடாக அங்கவீனமுற்ற நபர்களுக்குச் சுய தொழிற் பயிற்சியினை வழங்கிய வேளையில்

Training on self employment for PWDs conducted by CBR programme



සී.බී.ආර්. ව්‍යාපෘතිය මගින් පවත්වනු ලැබූ නායකත්ව වැඩමුළුවක අවස්ථාවක්

சீ.பீ.ஆர். நிகழ்ச்சித் திட்டத்தினூடாக நடாத்தப்பட்ட தலைமைத்துவப் பட்டறை

Leadership workshop conducted by CBR programme



උපදේශන අංශය මගින් පවත්වනු ලැබූ උපදේශන වැඩසටහනක අවස්ථාවක්

உளவளத்துணைப் பிரிவினூடாக நடாத்தப்பட்ட உளவளத்துணை நிகழ்ச்சித் திட்டம்

.

Counseling programme conducting by counseling Division



උපදේශන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ යෝග වැඩසටහනක්

உளவளத்துணைப் பிரிவினால் நடாத்தப்பட்ட யோகாசன வேலைத்திட்டம்.

Yoga exercises programme conducted by counseling division



නිවාසාධාර ලබාදුන් ආබාධිත පුද්ගලයෙකුගේ නිවසකට මුල්ගල තබන අවස්ථාව

வீடமைப்பு உதவி வழங்கப்பட்ட அங்கவீனமுற்ற நபர் ஒருவருக்கு வீட்டுக்கான அடிக்கல் நாட்டப்பட்ட வேளையில்

Laying the first stone of the house of a disabled



තනි මාපිය පවුල් සංවර්ධන ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියා සඳහා අධාර ලබාදුන් කාන්තාවක්

தனியொருவரினைத் தலைவராகக் கொண்ட குடும்பங்களை விருத்தி செய்யும் நிகழ்ச்சித் திட்டத்தினூடாக சுய தொழில் உதவி பெண் ஒருவருக்கு வழங்கப்படுதல்.

Women received the assistance for self employment under the Single Parent Development programme



සමාජ සත්කාරක ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියා සඳහා අධාර ලබාදුන් කාන්තාවක්

சமூகப் பராமரிப்புக் கருத்திட்டத்தினூடாக சுயதொழிலுக்கான உதவியினை பெண் ஒருவர் பெற்றுக் கொள்ளுதல்.

Women received the assistance for self employment under the Social Care project



සමාජ සත්කාරක සංකල්පය හඳුන්වා දෙමින්

சமூகப் பராமரிப்பு எண்ணக்கருவினை அறிமுகஞ் செய்தல்.

Introducing the concept of Social Care